# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත

---

[සහතිකය සටහන් කළේ 2003 මාර්තු මස 17 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2003 මාර්තු මස 21 වැනි දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදි

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : රු. 41.75 යි. තැපැල් ගාස්තුව : රු. 11.25 යි.

**2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත**

[සහතිකය සටහන් කළේ 2003 මාර්තු මස 17 වන දින]

එල්.ඩී.—ඕ. 27/97.

**පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පිහිටුවීම සඳහා ද ; ඵලදායී තරඟකාරිත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා සහ පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම සඳහා ද ; අභ්‍යන්තර වෙළෙඳාම විධිමත් කිරීම සඳහා ද ; පාරිභෝගික කටයුතු පිළිබඳ සභාවක් පිහිටුවීම සඳහා ද ; 1979 අංක 1 දරන පාරිභෝගිකයන් ආරක්ෂා කිරීමේ පනත, 1987 අංක 1 දරන සාධාරණ වෙළෙඳ කොමිෂන් සභා පනත, සහ (173 වන අධිකාරය වූ) මිල පාලනය කිරීමේ පනත ඉවත් කිරීම සඳහා ද ; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික සියලු කාරණා සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

පූර්විකාව.

වෙළෙඳාම සහ භාණ්ඩ හා සේවාවල මිල විධිමත් කිරීම මගින් පාරිභෝගිකයන් වඩා හොඳින් ආරක්ෂා කිරීම සහ අසාධාරණ වෙළෙඳ පිළිවෙත් හා සීමිත වෙළෙඳ පිළිවෙත්වලට එරෙහිව වෙළෙන්දන් හා සාදන්නන් ආරක්ෂා කිරීම ද සඳහා විධිවිධාන සැලැස්වීම ශ්‍රී ලංකා ආණ්ඩුවේ ප්‍රතිපත්තිය වන හෙයින් ද :

හැකි කවර හෝ අවස්ථාවක දී තරඟකාරී මිල ප්‍රවර්ධනය කිරීමේ සහ භාණ්ඩ හා සේවා වෙළෙන්දන් හා සාදන්නන් අතර යහපත් තරඟයක් තිබිය යුතු බවට වගබලා ගැනීමේ අභිලාෂයක් ශ්‍රී ලංකා ආණ්ඩුවට ඇති හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත යනුවෙන් සඳහන් කරනු ලැබේ. ලුහුඬු නාමය.

I වන කොටස

**පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පිහිටුවීම**

2. (1) (මෙහි මින් මතු 'අධිකාරිය' යනුවෙන් සඳහන් කරනු ලබන) පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය යනුවෙන් හඳුන්වනු ලබන අධිකාරියක් මෙයින් පිහිටුවනු ලබන අතර එය 3 වන වගන්තිය යටතේ තත්කාලයේ අධිකාරියේ සාමාජිකයන් වන තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියක් පිහිටුවීම.

2 –H 017418– 4,500 (2002/11)

(2) අධිකාරිය, (1) වන උපවගන්තියෙන් ඊට වෙන්කර දෙන ලද නමින් සංස්ථාවක් විය යුතු අතර ඊට අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් තිබිය යුතු ය. සංස්ථාවට එම නමින් එය විසින් සහ ඊට විරුද්ධව ද නඩු පැවරිය හැකි ය.

අධිකාරියේ සංයුතිය.

**3.** (1) අධිකාරිය, සභාපතිවරයකුගෙන් සහ කර්මාන්ත, නීතිය, ආර්ථික විද්‍යාව, වාණිජ්‍යය, පරිපාලනය, ඉංජිනේරුකරණය, විද්‍යාව හෝ සෞඛ්‍යය යන ක්ෂේත්‍රවල පිළිගත් සුදුසුකම් ඇත්තා වූ ද, ඒ ක්ෂේත්‍රවල පෘථුල පළපුරුද්දක් සහ විශිෂ්ටත්වයක් ලබා ඇත්තා වූ ද, තැනැත්තන් අතරින් අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන තවත් සාමාජිකයන් දහ දෙනකුට නොඅඩු සංඛ්‍යාවකින් ද සමන්විත විය යුතු ය.

(2) සභාපතිවරයා සහ (1) වන උපවගන්තිය යටතේ පත්කරනු ලැබූ සාමාජිකයන් අතරින් අමාත්‍යවරයා විසින් තෝරාගනු ලබන සාමාජිකයන් තුන් දෙනකු (මෙහි මින් මතු "පූර්ණ කාලීන සාමාජිකයන්" යනුවෙන් හඳුන්වනු ලබන) අධිකාරියේ පූර්ණ කාලීන සාමාජිකයන් විය යුතු ය.

(3) සභාපතිවරයා සහ පූර්ණකාලීන සාමාජිකයන් තුන්දෙනා හැර, අධිකාරියේ සෙසු සාමාජිකයන්ට මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන පාරිශ්‍රමිකයන් ගෙවිය යුතු ය.

(4) අධිකාරියේ සාමාජිකයන්ගේ ධූර කාලය, අධිකාරියේ රැස්වීම් සහ මුද්‍රාව සම්බන්ධයෙන් මේ පනතේ උපලේඛනයේ විධිවිධාන බලාත්මක විය යුතු ය.

සභාපති සහ පූර්ණකාලීන සාමාජිකයන්.

**4.** අධිකාරියේ සභාපතිවරයා සහ පූර්ණකාලීන සාමාජිකයන් ඔවුන්ගේ ඒ ඒ පත්වීම්වල දිනයේ සිට අවුරුදු තුනක කාලයක් සඳහා එක් එක් නිලධරයා විසින් ධූරය දැරිය යුතු ය. මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන පාරිශ්‍රමිකයක් ඔවුන්ගේ සේවා සඳහා ගෙවිය යුතු ය.

අධ්‍යක්ෂ ජනරාල්වරයා අධිකාරියේ ලේකම් වශයෙන් කටයුතු කළ යුතු බව.

**5.** 52 වන වගන්තිය යටතේ පත් කරන ලද අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා අධිකාරියේ ලේකම් වශයෙන් කටයුතු කළ යුතු ය.

රජයේ නිලධරයන්ට බලතල පැවරීම.

**6.** අධිකාරිය විසින්, මේ පනත යටතේ කර්තව්‍ය ඉටුකිරීමේ කාර්යය සඳහා මේ පනත මගින් හෝ යටතේ අධිකාරිය වෙත පැවරුණු හෝ නියම කරනු ලැබූ හෝ වෙන්කර දෙනු ලැබූ යම්නාක් වූ කර්තව්‍ය යම් රජයේ නිලධරයකුට, ඒ නිලධරයා සහ අධිකාරිය අතර එකඟ වන නියම සහ කොන්දේසි මත, නමින් හෝ නිලයෙන් පැවරිය හැකි ය.

අධිකාරියේ අරමුණු.

**7.** අධිකාරියේ අරමුණු පහත සඳහන් පරිදි විය යුතු ය :—

(අ) පාරිභෝගිකයන්ගේ ජීවිත සහ දේපළවලට උපද්‍රවයක් සිදුවන භාණ්ඩ අලෙවි කිරීමට සහ සේවා සැපයීමට එරෙහිව පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම ;

(ආ) අසාධාරණ වෙළෙඳ පිළිවෙත්වලට විරුද්ධව පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම සහ පාරිභෝගිකයන්ගේ අයිතිවාසිකම්වලට නිසි සැලකිල්ල දැක්වීමට සහතික වීම ;

(ඇ) හැකි සෑම විටම, පාරිභෝගිකයන්ට, තරඟකාරී මිලට භාණ්ඩ හා සේවාවලට ප්‍රමාණවත් ප්‍රවේශයක් ලබාදීමට සහතික වීම ; සහ

(ඈ) අසාධාරණ වෙළෙඳ පිළිවෙත්, සීමිත වෙළෙඳ පිළිවෙත් හෝ වෙළෙන්දන් විසින් සිදුකරන වෙනත් යම් ආකාරයක පාරිභෝගික සූරාකෑම්වලට එරෙහිව සහනයක් ලබාදීම.

අධිකාරියේ කර්තව්‍ය.

**8.** අධිකාරියේ කර්තව්‍ය පහත දැක්වෙන පරිදි විය යුතු ය :–

(අ) (i) ව්‍යවසායයන් අතර සීමාකාරී ගිවිසුම් ;

(ii) ව්‍යවසායයන් අතර මිල පිළිබඳ වැඩ පිළිවෙලවල් ;

(iii) වෙළෙඳපොළ ඇතුළත හෝ වෙළෙඳපොළේ සැලකිය යුතු කොටසක දේශීය වෙළෙඳාම හෝ ආර්ථික සංවර්ධනය පිළිබඳ වූ ආධිපත්‍ය තත්ත්වයක් අනිසි ලෙස යොදා ගැනීම ; හෝ

(iv) දේශීය හෝ ජාත්‍යන්තර වෙළෙඳාමට හෝ ආර්ථික සංවර්ධනයට අහිතකර ලෙස බලපාන තරඟකාරිත්වය පිළිබඳ යම් අවහිරයක්

පාලනය කිරීම හෝ ඉවත් කිරීම ;

(ආ) තරඟ විරෝධී චර්යා හා ආධිපත්‍ය තත්ත්වයක් අහිමි ලෙස යොදා ගැනීම පිළිබඳ විමර්ශන හෝ පරීක්ෂණ කිරීම ;

(ඇ) භාණ්ඩ සහ සේවා සපයන තැනැත්තන් අතර ඵලදායී තරඟකාරිත්වය පවත්වා ගැනීම හා ප්‍රවර්ධනය කිරීම ;

(ඈ) භාණ්ඩ හා සේවාවල මිල, ඒවා ලබාගත හැකිවීම සහ ඒවායෙහි තත්ත්වය සහ සපයන වර්ගය සම්බන්ධයෙන් පාරිභෝගිකයන්ගේ, මිල දී ගන්නන්ගේ සහ භාණ්ඩ හා සේවා භාවිත කරන අයගේ අයිතිවාසිකම් සහ සම්බන්ධතා ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම ;

(ඉ) මිල දී ගැනීමට තබා ඇති භාණ්ඩ සහ සේවාවල තත්ත්වය, ප්‍රමාණය, ශක්තිය, පිරිසිදුකම, ප්‍රමිති සහ මිල පිළිබඳව පාරිභෝගිකයන් දැනුවත් කිරීම ;

(ඊ) මේ පනතේ නිශ්චිතව සඳහන් කර ඇති යම් කාරණයක් සම්බන්ධයෙන් විමර්ශන සහ පරීක්ෂණ පැවැත්වීම ;

(උ) වෙළෙඳපොළ තරඟකාරිත්වය අඩු ඵලදායිතාවෙන් පවතින අවස්ථාවල දී වෙළෙඳපොළෙහි තරඟකාරී මිල ප්‍රවර්ධනය කිරීම ;

(ඌ) වෙළෙඳපොළ තත්ත්ව සහ පාරිභෝගික කටයුතුවලට අදාළව අධ්‍යයන භාර ගැනීම, වාර්තා පළකිරීම සහ මහජනතාවට තොරතුරු සැපයීම ;

(එ) රාජ්‍ය අංශයේ හා පෞද්ගලික අංශයේ කාර්යක්ෂමතාව පිළිබඳ අධ්‍යයන භාර ගැනීම ;

(ඒ) පාරිභෝගිකයන්ගේ මනා සෞඛ්‍යය, ආරක්ෂාව සහ සුරක්ෂිතභාවය සම්බන්ධයෙන් පාරිභෝගික අධ්‍යාපන ප්‍රවර්ධනය කිරීම ;

(ඹ) වෙළෙඳපොළ තත්ත්වය සහ පාරිභෝගික කටයුතු පිළිබඳ තොරතුරු වෙනත් ආයතන සමග හුවමාරු කරගැනීම ප්‍රවර්ධනය කිරීම ;

(ඹ්) පාරිභෝගික සංවිධාන පිහිටුවීම ප්‍රවර්ධනය කිරීම, උපකාර කිරීම සහ උනන්දු කිරීම ;

(ක) අධිකාරිය විසින් ලබාදෙනු ලබන යම් සේවාවක් සම්බන්ධයෙන් ගාස්තු අය කිරීම ;

(ග) අධිකාරියේ කර්තව්‍යයන් ඉටුකිරීමේ පහසුකම් සැලැස්වීමට අවශ්‍ය විය හැකි පරිදි කිසියම් ආකාරයක කමිටුවක් හෝ කමිටු පත්කිරීම ; සහ

(ච) අධිකාරියේ අරමුණු මුදුන් පමුණුවා ගැනීම සඳහා සහ අධිකාරියේ කර්තව්‍ය ඵලදායි ලෙස ඉටු කිරීම සඳහා අවශ්‍ය සියලු වෙනත් කටයුතු කිරීම.

II වන කොටස

**වෙළෙඳාම විධිමත් කිරීම**

9. අධිකාරිය විසින්— භාණ්ඩ සහ සේවා බෙදාහැරීම පිළිබඳ අධ්‍යයනය කිරීම අධිකාරිය විසින් භාරගත හැකි බව.

(අ) යම් පංතියකට අයත් භාණ්ඩ සහ සේවා කිසිවක් සතුටුදායක තත්ත්වයකට ද සාධාරණ මිලකට ද සෑහෙන ප්‍රමාණයකට ද පාරිභෝගිකයාට ලබාගත හැකි වන බවට සහතික වන පරිදි විකිණීම හෝ සැපයීම සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීම භාර ගැනීම ද ;

(ආ) (අ) ඡේදයෙහි විස්තර කර ඇති කාර්යය සඳහා පාරිභෝගිකයන්ගේ සංවිධාන ද ඇතුලු රාජ්‍ය හෝ වෙනත් සංවිධාන ප්‍රවර්ධනය කිරීම, ඒවාට සහාය දීම සහ ඒවා උනන්දු කිරීම ද ; සහ

(ඇ) 14 වන වගන්තියෙහි විස්තර කර ඇති කාර්යය සඳහා අධිකාරිය සමග ගිවිසුම්වලට එළඹීමට වෙළෙන්දන්ගේ සංගම්වලට සහාය දීම සහ ඒවා උනන්දු කිරීම ද

කරනු ලැබිය හැකි ය.

භාණ්ඩ මිල ලකුණු කිරීම, ලේබල් කිරීම සහ ඇසිරීම සම්බන්ධයෙන් අධිකාරිය විසින් සාදන්නන්ට හෝ වෙළෙඳුන්ට විධාන නිකුත් කළ යුතු බව.

**10.** (1) අධිකාරිය විසින්, පාරිභෝගිකයා ආරක්ෂා කරනු පිණිස—

(අ) භාණ්ඩ කිසිවක් ලේබල් කිරීම, මිල ලකුණු කිරීම, ඇසිරීම, විකිණීම හෝ සැදීම සම්බන්ධයෙන් සාදන්නන්ට හෝ වෙළෙඳුන්ට සාමාන්‍ය විධාන නිකුත් කරනු ලැබිය හැකි ය ; තව ද,

(ආ) (i) ඒ භාණ්ඩ විකුණනු ලැබිය හැකි වේලාවන් හා එසේ විකිණිය හැකි ස්ථාන ; සහ

(ii) භාණ්ඩ කිසිවක් සැදීම, ආනයනය කිරීම, ලේබල් කිරීම, ගබඩා කිරීම, විකිණීම හා ඇසිරීම පිළිබඳ වෙනත් යම් කොන්දේසි නිශ්චිත සඳහන් කෙරෙන විශේෂ විධාන යම් පන්තියකට අයත් සාදන්නන් හෝ වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ අධිකාරිය විසින් නිකුත් කරන ලද සෑම විධානයක්ම, ගැසට් පත්‍රයේ සහ යටත් පිරිසෙයින් එක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි පුවත්පත් පත්‍රයක පළ කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද යම් විධානයකට අනුකූලව කටයුතු කිරීම පැහැර හරින යම් සාදන්නකු හෝ වෙළෙන්දකු මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේ ය.

(4) (1) වන උපවගන්තිය යටතේ විධානයක් නිකුත් කර ඇත්තේ යම් භාණ්ඩයක් සම්බන්ධයෙන් ද ඒ භාණ්ඩයේ ඇති යම් ලේබලයක්, විස්තරයක් හෝ මිල ලකුණු කිරීමක්, ඉවත් කරන, වෙනස් කරන, කපා හරින, මකා හරින හෝ විකෘති කරන හෝ ලේබලය, විස්තරය හෝ මිල ලකුණු කිරීම ඉවත් කර, වෙනස් කර, කපා හැර, මකා හෝ විකෘති කර ඇති එවැනි යම් භාණ්ඩයක් විකුණන හෝ විකිණීමට ඉදිරිපත් කරන යම් තැනැත්තකු, මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේ ය.

ලකුණු කරන ලද මිලට වැඩි මිලකට විකිණීම හෝ විකිණීම සඳහා ඉදිරිපත් කිරීම.

**11.** 10 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද විධානයකට අනුව භාණ්ඩයෙහි ලකුණු කරන ලද මිලට වැඩි මිලකට යම් භාණ්ඩයක් විකුණන හෝ විකිණීම සඳහා ඉදිරිපත් කරන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේ ය.

භාණ්ඩවලට සහ සේවා සැපයීමට අදාළ ප්‍රමිති සහ පිරිවිතර නියම කිරීම.

**12.** (1) අධිකාරිය විසින්, පාරිභෝගිකයා ආරක්ෂා කිරීමේ හා විකුණනු ලබන භාණ්ඩ හෝ සපයනු ලබන සේවාවල තත්ත්වය සහතික කිරීමේ කාර්යය සඳහා, යම් භාණ්ඩයක නිෂ්පාදනය, සැදීම, සැපයීම, ගබඩා කිරීම, ප්‍රවාහනය කිරීම සහ විකිණීම සහ යම් සේවා සැපයීමට අදාළ ප්‍රමිති සහ පිරිවිතර ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයක් මගින් කලින් කල නියම කළ හැකි ය.

(2) 1984 අංක 6 දරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින්, යම් භාණ්ඩයක් නිෂ්පාදනය කිරීම, සැදීම, සැපයීම, ගබඩා කිරීම, ප්‍රවාහනය කිරීම සහ විකිණීම සහ යම් සේවා සැපයීම සම්බන්ධයෙන් නියම කරන ලද ප්‍රමිති සහ පිරිවිතර, අධිකාරිය විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයක් මගින් (1) වන උපවගන්තිය යටතේ නියම කරන ලද ප්‍රමිති සහ පිරිවිතර වශයෙන් පිළිගනු ලැබිය හැකි ය.

පැමිණිලි ගැන අධිකාරිය විසින් පරීක්ෂා කළ යුතු බව.

**13.** (1) අධිකාරිය විසින් පහත දැක්වෙන දේ සම්බන්ධයෙන් වූ පැමිණිලි සඳහා පරීක්ෂණ පවත්වනු ලැබිය හැකි ය :—

(අ) 12 වන වගන්තිය යටතේ නියම කරන ලද ප්‍රමිති හා පිරිවිතරවලට අනුකූල නොවන යම් භාණ්ඩයක් නිෂ්පාදනය කිරීම, සැදීම, සැපයීම, ගබඩා කිරීම, ප්‍රවාහනය කිරීම හෝ විකිණීම සහ යම් සේවාවක් සැපයීම ; සහ

(ආ) සාදන්නා හෝ වෙළෙන්දා විසින් ව්‍යංගයෙන් හෝ අන් ආකාරයකින් දෙන ලද ප්‍රතිඥාහාරයකට හෝ සහතිකවීමකට අනුකූල නොවන යම් භාණ්ඩයක් සැදීම හෝ විකිණීම.

(2) යම් භාණ්ඩයක් විකිණීමට හෝ යම් සේවාවක් සැපයීමට අදාළව (1) වන උපවගන්තිය යටතේ වූ පැමිණිල්ලක් අවස්ථාවෝචිත පරිදි එම විකිණීමෙන් හෝ ඒ සේවය සැපයීමෙන් මාස තුනක් ඇතුළත අධිකාරිය වෙත ලියවිල්ලක් මගින් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ වූ පැමිණිල්ලක් පිළිබඳව පවත්වනු ලබන යම් පරීක්ෂණයක දී, එම පැමිණිල්ල කරනු

ලැබුවේ යම් සාදන්නකුට හෝ වෙළෙන්දකුට විරුද්ධව ද ඒ සාදන්නාට හෝ වෙළෙන්දාට අධිකාරිය විසින්, ඒ සම්බන්ධයෙන් පෞද්ගලිකව හෝ ඒ සඳහා නම් කරන ලද අනුයෝජිතයකු මඟින් හෝ කරුණු කියා සිටීමට අවස්ථාවක් දිය යුතු ය.

(4) පැමිණිල්ලක් විභාග කිරීමෙන් පසු, අධිකාරිය විසින් නිර්ණය කරන ලද හෝ නිර්ණය කරන ලද්දේ යයි සලකනු ලබන ප්‍රමිතිවලට හෝ පිරිවිතරවලට අනුකූල නොවන යම් භාණ්ඩයක් සෑදීම හෝ විකිණීම කර තිබෙන බව හෝ යම් සේවාවක් සපයා තිබෙන බව නැතහොත් සාදන්නා හෝ වෙළෙන්දා විසින් වාංගයෙන් හෝ අන් ආකාරයකින් දෙන ලද යම් ප්‍රතිඥාහාරයකට හෝ සහතිකවීමකට අනුකූල නොවන ආකාරයකට භාණ්ඩයක් සාදා ඇති බව හෝ විකුණා ඇති බව අධිකාරියේ මතය වන අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, අතෘප්තියට පත් පාර්ශවයට වන්දි ගෙවන ලෙස හෝ එම භාණ්ඩ ප්‍රතියෝජනය කරන ලෙස හෝ ඒ භාණ්ඩ සඳහා නැතහොත් සේවය සැපයීම සඳහා ගෙවන ලද මුදල ආපසු ගෙවන ලෙස අධිකාරිය විසින් ඒ සාදන්නාට හෝ වෙළෙන්දාට නියම කළ යුතු ය.

(5) (4) වන උපවගන්තිය යටතේ වූ නියමයක් ලියවිල්ලකින් කළ යුතු අතර, එය ලියාපදිංචි තැපෑලෙන් ඒ සාදන්නා හෝ වෙළෙන්දා වෙත දන්වා යැවිය යුතු ය.

(6) මේ වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ කරන ලද නියමයකට අනුකූලව කටයුතු කිරීමට යම් සාදන්නකු හෝ වෙළෙන්දකු විසින් පැහැර හරිනු ලැබූ හෝ ප්‍රතික්ෂේප කරනු ලැබූ අවස්ථාවක, එම සාදන්නා හෝ වෙළෙන්දා මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර, නියමය මත වන්දි හෝ ආපසු ගෙවීම් වශයෙන් අයවිය යුතු මුදල අවස්ථාවෝචිත පරිදි ඒ සාදන්නාගේ හෝ වෙළෙන්දාගේ ව්‍යාපාරික ස්ථානය හෝ නිවාසස්ථානය පිහිටි ස්ථානය අරබයා අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත් අධිකරණය වෙත අධිකාරිය විසින් තත් කාර්යය වෙනුවෙන් කරන ලද ඉල්ලීමක් මත, ඒ වන්දිය හෝ ආපසු ගෙවන මුදල ඒ අධිකරණයේ සාමාන්‍ය අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී එය විසින් පනවනු ලැබිය හැකි දඩයක ප්‍රමාණය ඉක්මවන්නේ වුව ද, ඒ අධිකරණය විසින් පනවනු ලැබූ දඩයක ආකාරයෙන් අයකර ගනු ලැබිය යුතු ය.

උපරිම මිල ආදිය සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ ගිවිසුම්.

**14.** (1) අධිකාරිය විසින්, යම් සාදන්නකු, වෙළෙන්දකු හෝ සාදන්නන්ගේ හෝ වෙළෙන්දන්ගේ සංගමයක් සමඟ—

(අ) යම් භාණ්ඩ විකිණිය යුතු නොවන්නේ යම් උපරිම මිලකට වැඩියෙන් ද එම උපරිම මිල ;

(ආ) සාදනු ලබන, විකුණනු ලබන හෝ විකිණීම සඳහා ඉදිරිපත් කරනු ලබන යම් භාණ්ඩයක ප්‍රමිතිය සහ පිරිවිතර ;

(ඇ) යම් භාණ්ඩයක් සෑදීම, ආනයනය කිරීම, සැපයීම, ගබඩා කිරීම, බෙදා හැරීම, ප්‍රවාහනය කිරීම, අලෙවි කිරීම, ලේබල් කිරීම හෝ විකිණීම හා සම්බන්ධ වෙනත් යම් කොන්දේසි,

පිළිබඳව විධිවිධාන සැලැස්වීම සඳහා අධිකාරිය විසින් අවශ්‍ය යයි සලකන පරිදි ලිඛිත ගිවිසුම්වලට එළඹිය හැකි ය.

(2) අධිකාරිය හා යම් සාදන්නකු හෝ වෙළෙන්දකු හෝ සාදන්නන්ගේ හෝ වෙළෙන්දන්ගේ යම් සංගමයක් අතර (1) වන උපවගන්තිය යටතේ එළඹෙන ලද සෑම ලිඛිත ගිවිසුමක්ම ඒ සාදන්නාගේ හෝ වෙළෙන්දාගේ සෑම බලයලත් බෙදාහරින්නකු සහ ඒ සංගමයේ සෑම සාමාජිකයකුම, ඒ ගිවිසුම ඇති කර ගන්නා ලද අවස්ථාවේ දී ඔහු සාමාජිකයකු වුවද, නොවුවද ඒ ගිවිසුමට පාර්ශ්වකරුවකු වූ කලක මෙන් ඔහු කෙරෙහි අනුගමා විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ අධිකාරිය සමඟ එළඹුණු යම් ගිවිසුමක යම් විධිවිධානයක් කඩ කරන සෑම සාදන්නකුම හෝ වෙළෙන්දකුම හෝ ඒ සාදන්නාගේ හෝ වෙළෙන්දාගේ යම් බලයලත් බෙදාහරින්නකුම හෝ සාදන්නන්ගේ හෝ වෙළෙන්දන්ගේ යම් සංගමයක් හෝ එහි යම් සාමාජිකයකුම හෝ මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේ ය.

(4) (1) වන උපවගන්තිය යටතේ අධිකාරිය සමඟ එළඹෙන සෑම ගිවිසුමක් ම අධිකාරිය සමඟ ලියාපදිංචි කරනු ලැබිය යුතු අතර අවස්ථාවෝචිත පරිදි, ඒ සාදන්නාගේ හෝ වෙළෙන්දාගේ සෑම බලයලත් බෙදාහරින්නකුගේ සහ ඒ සංගමයේ සාමාජිකයන්ගේ නම සහ විස්තරය සඳහන් උපලේඛනයක් එහි ඇතුළත් විය යුතු ය.

(5) (1) වන උපවගන්තිය යටතේ අධිකාරිය සමඟ එළඹෙන ලද සෑම ගිවිසුමක්ම, එම ගිවිසුම යම් පසු දිනයක බලාත්මක විය යුතු බවට එම ගිවිසුමෙන් විධිවිධාන සලසා ඇත්තේ නම් මිස, එම ගිවිසුමේ දිනයේ සිට බලාත්මක විය යුතු ය.

(6) සුදුසු යයි අධිකාරිය විසින් අදහස් කරනු ලබන අවස්ථාවක, එය විසින් මේ වගන්තිය යටතේ ඇති කර ගත් යම් ගිවිසුමක් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමට සැලැස්විය හැකි ය. ගිවිසුමක් ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ අවස්ථාවක එම ගිවිසුම පළ කළ ගැසට් පත්‍රයේ පිටපතක් ඉදිරිපත් කිරීම, එහි පටහැනි තත්ත්වය ඔප්පු කරන තෙක්, එම ගිවිසුමේ අඩංගු දේ පිළිබඳව ඔප්පු කිරීමක් විය යුතු ය.

(7) මේ වගන්තිය යටතේ වූ නඩු පැවරීමක කාර්ය සඳහා, යම් තැනැත්තකු, යම් සැදන්නකුගේ හෝ වෙළෙන්දකුගේ බලයලත් බෙදාහරින්නකු හෝ, වෙළෙන්දන්ගේ හෝ සැදන්නන්ගේ සංගමයක සාමාජිකයකු බවට අධිකාරිය විසින් දෙන ලද සහතිකයක්, ආවේශ්‍ය විය යුතු අතර ඒ සහතිකය එම තැනැත්තා සැදන්නකුගේ හෝ වෙළෙන්දකුගේ බලයලත් බෙදාහරින්නකු හෝ ඒ සංගමයේ සාමාජිකයකු බවට අධිකරණයකට බැලූ බැල්මට පිළිගත හැකි සාක්ෂියක් විය යුතු ය.

භාණ්ඩ විකිණීම ප්‍රතික්ෂේප කිරීම වරදක් බව.

**15.** (1) ශ්‍රී ලංකාව ඇතුළත වෙළෙඳාම් කිරීමේ කාර්යය සඳහා තම සන්තකයෙහි හෝ භාරයෙහි හෝ තම පාලනය යටතේ හෝ යම් භාණ්ඩ ඇති කිසිම වෙළෙන්දකු විසින් එම භාණ්ඩ විකිණීම ප්‍රතික්ෂේප නොකළ යුතු ය.

(2) (1) වන උපවගන්තියෙහි විධිවිධාන කඩ කිරීම් සම්බන්ධයෙන් යම් වෙළෙන්දකුට විරුද්ධව යම් නඩු පැවරීමක දී—

(අ) ප්‍රශ්නයට අදාළ අවස්ථාවේ දී භාණ්ඩයෙහි සාධාරණ ප්‍රමාණයක් තමා විසින් සපයන ලද බව හෝ ඉල්ලා සිටින ප්‍රමාණය සැපයීම පිණිස අවශ්‍ය ප්‍රමාණයක් තමා සන්තකයෙහි නොතිබුණ බව ; හෝ

(ආ) එම භාණ්ඩ පිළිබඳ වෙළෙඳ ව්‍යාපාරය, තොග වෙළෙන්දකු ලෙස පමණක් තමා විසින් පවත්වාගෙන යන ලද බව සහ ගැනුම්කරු විසින් ඉල්ලා සිටි ප්‍රමාණය විකිණීම, තොග වෙළෙඳ ව්‍යාපාරයක සාමාන්‍ය පරිචයට පටහැනි විය හැකිව තිබුණු බව ; හෝ

(ඇ) ප්‍රශ්නයට අදාළ ඒ අවස්ථාවේ දී භාණ්ඩ විකිණීම යම් ලිඛිත නීතියක යම් විධිවිධානවලට හෝ 10 වන වගන්තිය යටතේ තමා වෙත නිකුත් කරන ලද යම් සාමාන්‍ය හෝ විශේෂ විධානයකට පටහැනි විය හැකිව තිබුණ බව,

ඔප්පු කිරීම, චූදිතයාට ප්‍රමාණවත් විත්තිවාචකයක් විය යුතු ය.

**16.** ශ්‍රී ලංකාව ඇතුළත වෙළෙඳාම් කිරීමේ කාර්යය සඳහා යම් ද්‍රව්‍යයක් තම සන්තකයෙහි හෝ භාරයෙහි හෝ තම පාලනය යටතේ ඇති කිසිම වෙළෙන්දකු විසින්—

වෙළෙඳාම් කිරීමේ කාර්යය සඳහා ඇති යම් ද්‍රව්‍යයක් සන්තකයෙහි නොමැති බව කීම හෝ ඒ ද්‍රව්‍ය යම් කොන්දේසියකට යටත්ව විකිණීම හෝ වරදක් බව.

(අ) ඒ භාණ්ඩ තම සන්තකයෙහි නොමැති බව කියා සිටීම ; හෝ

(ආ) ගැනුම්කරු විසින් ඒ භාණ්ඩයෙහි මිල නොපමාව ගෙවිය යුතු ය යන කොන්දේසිය හැර, වෙනත් යම් භාණ්ඩයක් මිලට ගැනීම නියම කිරීමේ හෝ යම් සේවාවක් වෙනුවෙන් යම් ගෙවීමක් කිරීමේ කොන්දේසියකට හෝ වෙනත් යම් කොන්දේසියකට හෝ යටත්ව ඒ භාණ්ඩය විකිණීම සඳහා ඉදිරිපත් කිරීම,

නොකළ යුතු ය.

**17.** (1) කිසිම වෙළෙන්දකු විසින් යම් භාණ්ඩයක් ඒ වෙළෙන්දාගේ සාමාන්‍ය වෙළෙඳ අවශ්‍යතාවන් ඉක්මවන ප්‍රමාණයකින් ඔහුගේ වෙළෙඳ ව්‍යාපාරික ස්ථානයෙහි හෝ වෙනත් යම් ස්ථානයක හෝ සඟවා තබා ගැනීම නොකළ යුතු ය.

යම් වෙළෙන්දකු හෝ තැනැත්තකු විසින් භාණ්ඩ රැස්කර තබා ගැනීම වරදක් බව.

(2) කිසිම වෙළෙන්දකු විසින් යම් භාණ්ඩයක්,

(අ) ඔහුගේ පෞද්ගලික පරිභෝජනය සහ ඔහුගේ ගෘහයේ සාමාජිකයන්ගේ පරිභෝජනය සඳහා අවශ්‍ය ප්‍රමාණය ; හෝ

(ආ) එම වෙළෙන්දාගේ සාමාන්‍ය වෙළෙඳ කටයුතුවලට අවශ්‍ය ප්‍රමාණය ; හෝ

ඉක්මවන ප්‍රමාණයකින් ස්වකීය ව්‍යාපාරික ස්ථානයෙහි හෝ වෙනත් යම් ස්ථානයක, ස්වකීය සන්තකයෙහි හෝ භාරයෙහි හෝ පාලනය යටතේ හෝ තබා නොගත යුතු ය.

(3) වෙළෙන්දකු නොවන වෙනත් කිසිම තැනැත්තකු විසින යම් භාණ්ඩයක් ඒ තැනැත්තාගේ සාමාන්‍ය පෞද්ගලික අවශ්‍යතාද ඉක්මවන ප්‍රමාණයකින් ස්වකීය සන්තකයෙහි හෝ භාරයෙහි හෝ පාලනය යටතේ හෝ තබා නොගත යුතු ය.

ඇතැම් භාණ්ඩවල සිල්ලර හෝ තොග මිල වැඩි කිරීම.

**18.** (1) යම් භාණ්ඩ හෝ යම් සේවාවක් ප්‍රජාවගේ හෝ එහි යම් කොටසකගේ ජීවිතයට අත්‍යවශ්‍ය බව අමාත්‍යවරයාගේ මතය වන අවස්ථාවක, අමාත්‍යවරයා විසින් අධිකාරිය විමසා, ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මඟින් ඒ භාණ්ඩ හෝ ඒ සේවාව අවස්ථාවෝචිත පරිදි, නිශ්චිත භාණ්ඩ හෝ නිශ්චිත සේවා ලෙස නියම කරනු ලැබිය හැකි ය.

(2) කිසිම සාදන්නකු හෝ වෙළෙන්දකු විසින් (1) වන උපවගන්තිය යටතේ නිශ්චිතව දක්වා ඇති යම් භාණ්ඩයක හෝ සේවාවක සිල්ලර හෝ තොග මිල අධිකාරියේ පූර්ව ලිඛිත අනුමතය ඇතිව මිස, වැඩි කරනු නොලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ අධිකාරියෙහි අනුමතය ලබා ගැනීමට බලාපොරොත්තු වන සාදන්නකු හෝ වෙළෙන්දකු විසින්, ඒ සඳහා අධිකාරිය වෙත ඉල්ලීමක් කරනු ලැබිය යුතු අතර, අධිකාරිය විසින්, උචිත යයි සලකනු ලබන යම් පරීක්ෂණයක් කිරීමෙන් පසුව :–

(අ) වැඩි කිරීම සාධාරණ යයි අධිකාරිය සැහීමට පත් වූ අවස්ථාවක, ඒ වැඩි කිරීම අනුමත කරනු ලැබිය යුතු ය ; නැතහොත්

(ආ) අධිකාරිය විසින් සාධාරණ යයි නිර්ණය කරනු ලබන වෙනත් යම් වැඩිකිරීමක් අනුමත කරනු ලැබිය යුතු ය.

තව ද, ඒ ඉල්ලීම ලැබී දින තිහක් ඇතුළත ස්වකීය තීරණය පිළිබඳව සාදන්නා හෝ වෙළෙන්දා වෙත දක්වා සිටිය යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ නියම කර ඇති පරිදි, ඉල්ලීමක් ලැබීමෙන් දින තිහක් ඇතුළත තීරණයක් දීමට අධිකාරිය අපොහොසත් වන අවස්ථාවක, (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, ඒ සඳහා ඉල්ලීම කළ සාදන්නා හෝ වෙළෙන්දා එසේ මිල වැඩි කිරීමට හිමිකම ලබන්නේ ය :

එසේ වුව ද, නියමිත කාලය ඇතුළත ස්වකීය තීරණය දීමේ දී ප්‍රමාදයක් සිදුවී ඇත්තේ ඉල්ලීම පිළිබඳව පරීක්ෂණ කටයුතු කරගෙන යාමේ දී අධිකාරියට අවශ්‍ය යම් සහායක් දීමට ඒ සාදන්නා හෝ වෙළෙන්දා අපොහොසත් වීම නිසා වන අවස්ථාවක, අධිකාරිය විසින්, ඉල්ලීම පිළිබඳව ස්වකීය තීරණය කරන තෙක් මිල වැඩි කිරීමෙන් එකී සාදන්නා හෝ වෙළෙන්දා වළක්වන අතුරු නියමයක් කිරීමේ බලය අධිකාරියට ඇත්තේ ය.

අධ්‍යක්ෂ ජනරාල් විසින් සභාවට කරුණු යොමුකළ යුතු බව.

**19.** (1) සාදන්නකු හෝ වෙළෙන්දකු විසින් අධික මිලකට භාණ්ඩ විකුණන බව හෝ සේවා සපයන බව හෝ එකී සාදන්නා හෝ වෙළෙන්දා විසින් සපයන ලද එකී භාණ්ඩ හා සේවා සම්බන්ධයෙන් යම් ආකාරයකට වෙළෙඳපොළ අයථා පරිදි භාවිත කිරීමක් හෝ වෙනත් යම් වෙළෙඳපොළ දෝෂයක් පවතින බව අධ්‍යක්ෂ ජනරාල්වරයාට පෙනී යන අවස්ථාවක, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඔහුට අවශ්‍ය යයි හැඟෙන පරිදි අධිකාරිය විමසීමෙන් සහ :—

(අ) ඒ භාණ්ඩ විකිණීම හෝ සේවා සැපයීම පොදු ආර්ථික වැදගත්කමකින් යුක්ත වන්නේ ද යන බව ; හෝ,

(ආ) ඒ අධික මිල යම් පාරිභෝගික කණ්ඩායමක් කෙරෙහි සැලකිය යුතු ආකාරයෙන් බලපාන්නේ ද යන බව,

සැලකිල්ලට ගනිමින්, ඒ කරුණ විමර්ශනය කර වාර්තා කිරීම සඳහා සභාව වෙත යොමු කරනු ලැබිය යුතු ය.

(2) ඒ යොමු කිරීමෙන් මාස දෙකක් ඇතුළත සභාව විසින් ස්වකීය විමර්ශන කටයුතු නිමකර, ස්වකීය වාර්තාව අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

19 වන වගන්තිය යටතේ කරන ලද යොමු කිරීමක් විමර්ශනය කිරීම.

**20.** (1) 19 වන වගන්තිය යටතේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සභාවට යම් යොමු කිරීමක් කරනු ලැබූ අවස්ථාවක, සභාවේ මතය අනුව ඒ යොමු කිරීම පිළිබඳව සභාව විසින් කළ යුතු යෝජිත විමර්ශනයේ දී ඒ පිළිබඳව සම්බන්ධතාවක් ඇතැයි සැලකෙන තැනැත්තන්ගේ දැනගැනීම සඳහා ඒ යොමු කිරීම ඉදිරිපත් කිරීමට සභාව කටයුතු සැලැස්විය යුතු අතර, විමර්ශන ආරම්භ කිරීමට නියමිත දිනය පිළිබඳව ප්‍රමාණවත් දැනුම් දීමක් ද වැඩිදුරටත් ඒ තැනැත්තන් වෙත කරනු ලැබිය යුතු ය.

(2) විමර්ශනයක් කිරීමේ කාර්යය සඳහා, සභාව විසින් යම් තැනැත්තකුට හෝ ඒ තැනැත්තා විසින් බලය දී ඇති යම් අයකුට ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින්, ඒ තැනැත්තාගේ භාරය හෝ පාලනය යටතේ ඇත්තා වූ ද විමර්ශනයට ලක් වූ කරුණට අදාළ වන්නා වූ ද, දැන්වීමේ නිශ්චිතව සඳහන් ලේඛන, එහි සඳහන් යම් වේලාවක සහ ස්ථානයක දී ඉදිරිපත් කළ යුතු යයි නියම කරනු ලැබිය හැකි ය.

(3) විමර්ශනයක් අවසානයේ දී, සභාව විසින්, 21 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, ස්වකීය තීරණය, ඊට හේතු ද සහිතව උචිත යයි සලකන යම් ආකාරයකින් ප්‍රකාශයට පත් කිරීමට සැලැස්විය යුතු අතර, 19 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ නියම කොට ඇති පරිදි ඒ විමර්ශනය පිළිබඳ වාර්තාවක් ද අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(4) භාණ්ඩ අධික මිලකට විකුණනු ලබන බවට හෝ සේවා අධික මිලකට සපයනු ලබන බවට සභාව නිගමනය කරන අවස්ථාවක, ඒ භාණ්ඩ නොවිකිණිය යුත්තේ හෝ ඒ සේවා නොසැපයිය යුත්තේ කවර උපරිම මිලකට නොවැඩිව ද ඒ උපරිම මිල, නැතහොත් ඒ උපරිම මිල නියම කරනු ලැබිය යුත්තේ කවර මිල ව්‍යුහයකට අනුකූලව ද ඒ මිල ව්‍යුහය, සභාව විසින් අධිකාරිය වෙත ලියවිල්ලකින් නිර්දේශ කළ යුතු ය.

(5) (4) වන උපවගන්තිය යටතේ සභාවේ නිර්දේශය ලැබීමෙන් අනතුරුව අධිකාරිය විසින් ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින්, ඒ භාණ්ඩ නොවිකිණිය යුත්තේ හෝ ඒ සේවා නොසැපයිය යුත්තේ කවර උපරිම මිලකට නොවැඩිව ද ඒ උපරිම මිල නියම කරනු ලැබිය යුතු ය. මේ උපවගන්තිය යටතේ සාදන ලද සෑම නියමයක් ම, ඒ නියමය ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දිනයේ සිට ක්‍රියාත්මක විය යුතු ය.

(6) මේ වගන්තිය යටතේ කලින් කරන ලද විමර්ශනයක විෂය කරුණු වූ ද, එම කරුණුවලට සම්පූර්ණයෙන් ම හෝ අර්ධ වශයෙන් අදාළ වන්නා වූ ද, තදනන්තර විමර්ශනයක් කරගෙන යාමෙන් සභාව වළක්වන ලෙසට මේ වගන්තියේ කිසිවක් තේරුම් නොගත යුතු ය.

(7) (5) වන උපවගන්තිය යටතේ, අධිකාරිය විසින් කරන ලද නියමයකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් ඒ තීරණයට විරුද්ධව අභියාචනාධිකරණය වෙත අභියාචනය කරනු ලැබිය හැකි ය.

(8) (2) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද දැන්වීමකට අනුකූලව ඉදිරිපත් කරනු ලැබූ යම් ලේඛනයක් රහස්‍ය ලේඛනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ ලේඛනයේ අන්තර්ගත කිසිවක් යම් නීතියක් යටතේ හෙළිදරව් කිරීමට නියම කරනු ලැබ ඇති අවස්ථාවක හැර, සභාව විසින් කිසිදු තැනැත්තකුට හෙළිදරව් නොකළ යුතු ය.

කරන ලද යොමු කිරීමක් සම්බන්ධයෙන් දිය හැකි ප්‍රතිඥාව.

**21.** (1) 20 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිර්දේශයක් කිරීමට පෙර යම් අවස්ථාවක දී, කරගෙන යනු ලබන විමර්ශනය යම් සාදන්නකු හෝ වෙළෙන්දකු සම්බන්ධයෙන් ද, අවස්ථාවෝචිත පරිදි, ඒ සාදන්නා හෝ වෙළෙන්දා විසින්, භාණ්ඩ විකුණනු ලැබිය යුතු වූ හෝ සේවා සපයනු ලැබිය යුතු වූ මිල පිළිබඳව දෙනු ලබන යම් ප්‍රතිඥාවක් සභාව විසින් පිළිගනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ දෙන ලද ප්‍රතිඥාවක් පිළිගනු ලැබූ අවස්ථාවක, සභාව විසින්, –

(අ) උචිත යයි එය සලකන ආකාරයකින් ඒ ප්‍රතිඥාවට ප්‍රමාණවත් ප්‍රචාරයක් දීම ;

(ආ) ඒ ප්‍රතිඥාව ක්‍රියාත්මක කිරීම කලින් කල සමාලෝචනය කිරීම ;

(ඇ) අවස්ථානුගත කරුණු අනුව යම් වෙනසක් සිදුවීමේ හේතුවෙන්––

(i) ප්‍රතිඥාව තවදුරටත් උචිත නොවන බව සහ ඒ නිසා ප්‍රතිඥාව ක්‍රියාත්මක කිරීමේ කාර්යයෙන් ඒ තැනැත්තා මුදවා හැරිය යුතු ද යන බව :

(ii) ප්‍රතිඥාවට සංශෝධන කිසිවක් කළ යුතු ද යන බව ; හෝ

(iii) පවත්නා ප්‍රතිඥාව අලුත් ප්‍රතිඥාවක් මඟින් ප්‍රතියෝජනය කළ යුතු ද යන බව

සලකා බැලීම ; සහ

(ඇ) ඒ ප්‍රතිඥාව දෙන තැනැත්තා වෙත, ප්‍රතිඥාව ක්‍රියාත්මක කිරීමේ දී ඒ තැනැත්තාගේ යම් පැහැර හැරීමක් හෝ අඩුපාඩුවක් පිළිබඳව දැනුම් දීම,

කළ යුතු වන්නේ ය.

(3) (2) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ ක්‍රියා කළ යුතු යයි සභාවේ අදහස වන අවස්ථාවක, සභාව විසින්,—

(අ) ප්‍රතිඥාවේ සිදු කිරීමට නියමිත වෙනස්කම් පිළිබඳව ;

(ආ) පවත්නා ප්‍රතිඥාව ප්‍රතියෝජනය කරනු ලැබිය යුතු අලුත් ප්‍රතිඥාවේ නියම පිළිබඳව ; හෝ

(ඇ) ප්‍රතිඥාව ක්‍රියාත්මක කිරීමේ කාර්යයෙන් ඒ තැනැත්තා මුදවා හැරීම පිළිබඳව,

ප්‍රතිඥාවට ඇතුළත් වූ තැනැත්තා වෙත දැන්වීමක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ දැන්වීමක් නිකුත් කිරීමෙන් පසුව, සභාව විසින්,—

(අ) සභාව විසින් කරන ලද නිර්දේශවලට අනුකූලව අලුත් ප්‍රතිඥාවකට හෝ ප්‍රතිඥාව සංශෝධනය කිරීමකට හෝ එකඟ වීමෙන් ; හෝ

(ආ) වෙළෙන්ද හෝ සාදන්නා විසින් ස්වකීය පෙළඹවීමෙන්ම ඉදිරිපත් කරනු ලබන අලුත් ප්‍රතිඥාවකට හෝ ප්‍රතිඥාව සංශෝධනය කිරීමකට එකඟවීමෙන්,

අලුත් තීරණයක් කරනු ලැබිය යුතු ය.

(5) සාදන්නකු හෝ වෙළෙන්දකු විසින් දෙන ලද ප්‍රතිඥාවක් මේ වගන්තිය යටතේ සභාව විසින් පිළිගනු ලැබූ අවස්ථාවක, ඒ සාදන්නා හෝ වෙළෙන්දා විසින් යම් ආකාරයකට ඒ ප්‍රතිඥාව කඩ කිරීම මේ පනත යටතේ වරදක් විය යුතු ය.

මහජනයා, හෝ සංගම්වල හෝ සංවිධානවල සාමාජිකයන් විසින් ඇතැම් කරුණු අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත යොමු කළ යුතු බව.

**22.** (1) අධික මිලකට භාණ්ඩ විකුණනු ලබන්නා වූ හෝ සේවා සපයනු ලබන්නා වූ සහ එම කාරණය පිළිබඳව සභාව විසින් විමර්ශනය කරනු ලැබීම පිළිබඳව මහජනයා අතුරෙන් යම් සාමාජිකයකු හෝ යම් පුද්ගල සංගමයක් හෝ සංවිධානයක් කැමැත්ත දක්වන්නා වූ අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, එම සාමාජිකයා, සංගමය හෝ සංවිධානය විසින්, කාරණය විමර්ශනය කිරීම සඳහා සභාවට යොමු කරන ලෙස අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් ඉල්ලා සිටිනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ ඉල්ලීමක් ලැබුණු විට, 19 වන වගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගනිමින්, එය සභාව විසින් විමර්ශනය කරනු ලැබිය යුතු කරුණක් බව අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ මතය වන අවස්ථාවක, එම කරුණ විමර්ශනය කිරීම සඳහා ඔහු විසින් සභාව වෙත යොමු කරනු ලැබිය හැකි අතර, 20 වන හා 21 වන වගන්තිවල විධිවිධාන. අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ විමර්ශනය සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

උපදේශක යොමු කිරීම.

**23.** අමාත්‍යවරයා විසින් සිය මෙහෙයවීමෙන්ම හෝ යම් තැනැත්තකු හෝ යම් පුද්ගල මණ්ඩලයක් විසින් ඔහු වෙත කරන ලද නියෝජන මත, යම් භාණ්ඩයක මිලට හෝ යම් සේවාවක් සඳහා අයකරන ගාස්තුවට අදාළ යම් ප්‍රශ්නයක් පරීක්ෂා කර වාර්තා කරන ලෙස අධිකාරියට යොමු කළ හැකි අතර, අධිකාරිය විසින් එම යොමුකිරීම ලැබුණ දින පටන් එක් මාසයක් ඇතුළත එම ප්‍රශ්නය පරීක්ෂා කර එහි වාර්තාව අමාත්‍යවරයා වෙත යැවිය යුතු ය.

භාණ්ඩ මිල ආදියට අදාළ ප්‍රශ්න, අධිකාරිය විසින් සමාලෝචනය කළ යුතු බව.

**24.** අධිකාරිය විසින්, සිය මෙහෙයවීමෙන්ම හෝ යම් තැනැත්තකු හෝ යම් පුද්ගල මණ්ඩලයක් විසින් එය වෙත කරන ලද නියෝජනය මත, යම් භාණ්ඩයක මිලට හෝ යම් සේවාවක් සඳහා අයකරන ගාස්තුවට අදාළ යම් ප්‍රශ්නයක් සමාලෝචනය කර අමාත්‍යවරයාට වාර්තා කළ හැකි ය.

මේ පනත යටතේ ඉදිරිපත් කරන ලද වාර්තාවක් පළ කිරීම.

**25.** මේ පනතේ විධිවිධාන යටතේ අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලද යම් වාර්තාවක් හෝ එම වාර්තාවෙහි කරන ලද යම් නිර්දේශ, සුදුසු යයි ඔහු අදහස් කරන ආකාරයකින් අමාත්‍යවරයා විසින් පළ කිරීමට සලස්වනු ලැබිය හැකි ය.

වෙළෙන්දකු විසින් මිල ලැයිස්තුව ප්‍රදර්ශනය කළ යුතු බව.

**26.** (1) මිල, භාණ්ඩයෙහි හෝ එහි එතුමේ හෝ එය අඩංගු ඇසුරුමේ හෝ යම් නීතියකින් අවශ්‍ය කර ඇති පරිදි වෙනත් යම් ආකාරයකින් හෝ ලකුණු කර ඇත්තේ නම් හැර, ස්වකීය ව්‍යාපාරික ස්ථානයෙහි විකිණීම සඳහා තිබෙන සෑම භාණ්ඩයකම, අවස්ථාවෝචිත පරිදි, උපරිම සිල්ලර මිල හෝ තොග මිල **දැක්වෙන දැන්වීමක් සෑම වෙළෙන්දකු විසින්ම** ඔහුගේ ව්‍යාපාරික ස්ථානයෙහි ප්‍රකටව පෙනෙන පරිදි ප්‍රදර්ශනය කළ යුතු ය.

(2) විකිණීම සඳහා තිබෙන සෑම භාණ්ඩයකම මිල පිළිබඳ සම්පූර්ණ ලැයිස්තුවක් අවශ්‍ය කවර හෝ අවස්ථාවක පරීක්ෂා කිරීම සඳහා සෑම කල්හිම ව්‍යාපාරික ස්ථානය ඇතුළත තබා තිබිය යුතු ය.

වෙළෙන්දන් ලියාපදිංචි කිරීම.

**27.** මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් නීරණය කරනු ලබන රුපියල් ලක්ෂයක් නොඉක්මවන වාර්ෂික ගාස්තුවක් ගෙවීම මත සෑම වෙළෙන්දකුම අධිකාරියෙහි ලියාපදිංචි විය යුතු ය.

ගැනුම්කරුවන්ට වෙළෙන්දා විසින් කුවිතාන්සි නිකුත් කළ යුතු බව

**28.** යම් භාණ්ඩ විකුණන සෑම වෙළෙන්දකු විසින් ම, භාණ්ඩයක ගැනුම්කරුවකු ඉල්ලා සිටින අවස්ථාවක දී—

(අ) විකිණීම කළ දිනය ;

(ආ) විකුණන ලද එම භාණ්ඩ ප්‍රමාණය ;

(ඇ) එම ප්‍රමාණය සඳහා ගෙවන ලද මිල ;

(ඈ) ගනුදෙනුවේ ස්වභාවය, එනම්, විකිණීම තොග වශයෙන ද, සිල්ලර වශයෙන් ද යන වග ; සහ

(ඉ) වෙළෙන්දකු විසින් කුවිතාන්සි නිකුත් කිරීමට අදාළ යම් නීතියක් යටතේ පනවනු ලැබිය හැකි වෙනත් යම් නියම,

දැක්වෙන කුවිතාන්සියක් එම ගැනුම්කරු වෙත නිකුත් කළ යුතු ය.

වෙළෙන්දා විසින් දැන්වීම් පුවරුවක් පැවසිය යුතු බව.

**29.** (1) මේ පනත යටතේ අධිකාරිය විසින් නිකුත් කරනු ලබන යම් දැන්වීමක්, විධානයක් හෝ කරනු ලබන යම් අවවාදයක් ප්‍රදර්ශනය කිරීම සඳහා දැන්වීම් පුවරුවක් සෑම වෙළෙන්දකු විසින් ම, ස්වකීය ව්‍යාපාරික ස්ථානයේ ප්‍රකටව පෙනෙන තැනක තැබිය යුතු ය.

(2) සෑම වෙළෙන්දකු විසින්ම, අධිකාරිය විසින් මේ පනත යටතේ ඒ වෙළෙන්ද වෙත නිකුත් කරන ලද යම් දැන්වීමක්, විධානයක් හෝ අවවාදයක් ඒ දැන්වීම් පුවරුවෙහි ඇලවීම හෝ ඇලවීමට සැලැස්වීම හෝ කළ යුතු ය.

(3) අධිකාරියේ විධානය හෝ බලය යටතේ ක්‍රියා කරන තැනැත්තකු නොවන, එවැනි දැන්වීමක්, විධානයක් හෝ අවවාදයක් ඉවත් කරන, වෙනස් කරන, කඩුගා දමන, මකා දමන හෝ විකෘති කරන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේ ය.

නොමග යවන සුළු, රවටන සුළු පැවැත්ම

30. කිසිම වෙළෙන්දකු විසින්, වෙළෙඳාමක් හෝ ව්‍යාපාරයක් හෝ කරගෙන යාමේ දී, පාරිභෝගිකයා හෝ වෙනත් යම් වෙළෙන්දකු නොමග යවන සුළු හෝ රවටන සුළු වූ හෝ නොමග යැවීමට හෝ රැවටීමට තුඩුදෙන සුළු වූ හෝ ආකාරයක පැවැත්මක නියුතු නොවිය යුතු ය.

අසත්‍ය නියෝජන

31. භාණ්ඩ හෝ සේවා සැපයීම් නැතහොත් සිදුවිය හැකි එබඳු සැපයීමක් සම්බන්ධයෙන් වූ හෝ භාණ්ඩ හෝ සේවා සැපයීම හෝ ප්‍රයෝජනයට ගැනීම යම් ආකාරයකින් තංවාලීම සම්බන්ධයෙන් වූ හෝ වෙළෙඳාමක් නැතහොත් ව්‍යාපාරයක් කරගෙන යාමේ දී—

(අ) භාණ්ඩ හෝ සේවා යම් විශේෂිත ප්‍රමිතියක, තත්ත්වයක, හෝ ශ්‍රේණියක ඒවා බව හෝ භාණ්ඩ නිශ්චිත ශෛලියක හෝ මෝස්තරයක ඒවා බව හෝ අසත්‍ය ලෙස දන්වා සිටින ;

(ආ) භාණ්ඩ අලුත් ඒවා බව අසත්‍ය ලෙස දන්වා සිටින ;

(ඇ) භාණ්ඩවලට හෝ සේවාවලට නොමැති අනුග්‍රාහකත්වයක්, අනුමතයක්, කාර්ය සාධනයක්, ස්වභාවයක්, උපකාරකයක්, ප්‍රයෝජනයක් හෝ ප්‍රතිලාභයක් ඇතැයි කියා සිටින ;

(ඈ) තමාට නොමැති අනුග්‍රාහකත්වයක්, අනුමතයක් හෝ සම්බන්ධතාවක් තමාට ඇතැයි කියා සිටින ;

(ඉ) මිල අඩු කිරීම්, හෝ මිල වැඩි කිරීම් පැවතීම පිළිබඳව හෝ ඒවායේ ප්‍රමාණය පිළිබඳව හෝ අසත්‍ය වූ හෝ නොමග යවන සුළු ප්‍රකාශ කරන ;

(ඊ) භාණ්ඩ, සේවා, ප්‍රතියෝජනය කිරීම් හෝ අලුත්වැඩියා කිරීම සඳහා වූ අවශ්‍යතා පිළිබඳව අසත්‍ය වූ හෝ නොමග යවන සුළු ප්‍රකාශ කරන ; හෝ

(ඉ) යම් ප්‍රතිඥාහාරයක හෝ සහතික විමක පැවතීම හෝ එහි බලපෑම පිළිබඳව අසත්‍ය වූ හෝ නොමඟ යවන සුළු ප්‍රකාශ කරන,

යම් වෙළෙන්දෙක්, මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේ ය.

භාණ්ඩ හෝ සේවා සැපයීම සම්බන්ධයෙන් අදාළ ප්‍රතිඥාහාර.

**32.** (1) පාරිභෝගිකයකුට භාණ්ඩ සැපයීම හෝ සේවා සැලසීම පිළිබඳ වෙළෙඳ ව්‍යාපාරයක් කරගෙන යාමේ දී යම් තැනැත්තකු විසින් එසේ භාණ්ඩ සැපයීම හෝ සේවා සැලසීම සඳහා වූ සෑම ගිවිසුමකම-

(අ) නිසි සැලකිල්ල සහ නිපුණතාව ඇතිව ඒ සේවා සලසනු ලබන බවට ද ;

(ආ) ඒ සේවාවන් සැලසීමට අදාළව සපයනු ලබන යම් ද්‍රව්‍ය, ඒවා සපයනු ලබන්නේ යම් කාර්යයක් සඳහා ද ඒ කාර්යයට සාධාරණව සුදුසු වන බවට ද ;

(ඇ) සපයනු ලබන භාණ්ඩ හෝ සලසනු ලබන සේවා මේ පනතේ 12 වන වගන්තියේ නිශ්චය කර ඇති ප්‍රමිති හා පිරිවිතරවලට අනුකූල වන බවට ද ; සහ

(ඈ) සපයනු ලබන භාණ්ඩ, ඒවා සපයනු ලබන්නේ යම් කාර්යයක් සඳහා ද ඒ කාර්යයට සාධාරණව සුදුසු වන බවට ද,

ව්‍යංජිත ප්‍රතිඥාහාරයක් ඇත්තේ ය.

(2) ව්‍යාපාරයක් කරගෙන යාමේ දී වෙළෙන්දකු විසින් හෝ වෙළෙන්දකු නොවන වෙනත් යම් තැනැත්තකු විසින් හෝ පාරිභෝගිකයකුට යම් භාණ්ඩ සපයන්නා වූ හෝ යම් සේවා සලසන්නා වූ ද භාණ්ඩ හෝ සේවා අවශ්‍ය වන්නේ යම් විශේෂ කාර්යයක් සඳහා ද, ඒ අරමුණ හෝ සේවා මගින් ලබා ගැනීමට තමා අපේක්ෂා කරන ප්‍රතිඵලය හෝ පාරිභෝගිකයා විසින් ප්‍රකාශිතව ම හෝ ව්‍යංගයෙන් හෝ වෙළෙන්දාට හෝ වෙනත් තැනැත්තාට දැනගැනීමට සලස්වන්නා වූ ද අවස්ථාවක, වෙළෙන්දාගේ හෝ ඒ වෙනත් යම් තැනැත්තාගේ නිපුණත්වය හෝ විනිශ්චය ගැන පාරිභෝගිකයා විශ්වාසය නොතබන බව හෝ ඔහු එසේ විශ්වාසය තැබීම යුක්ති සහගත නොවන බව හෝ අවස්ථානුගත කරුණුවලින් පෙනී යන අවස්ථාවල දී හැර, සේවා සැපයීම සඳහා වූ ගිවිසුම යටතේ සපයන ලද සේවා සහ

ඒ සේවාවන්ට අදාළව සපයන ලද යම් ද්‍රව්‍ය ඒ අරමුණු සඳහා සාධාරණ ලෙස සුදුසු බවට හෝ ඒ ප්‍රතිඵලය ලැබෙනැයි සාධාරණව අපේක්ෂා කළ හැකි ස්වභාවයක හෝ තත්ත්වයක ඒවා පවතින බවට හෝ ව්‍යංජිත ප්‍රතිඥාහාරයක් ඇත්තේ ය.

(3) (1) වන හෝ (2) වන උපවගන්තියෙහි විධිවිධාන සලසා ඇති පරිදි වූ ව්‍යංජිත ප්‍රතිඥාහාරය කඩ කිරීමකින් අගතියට පත් පාරිභෝගිකයකු විසින්, අවස්ථාවෝචිත පරිදි ඒ භාණ්ඩ සැපයීමෙන් හෝ ඒ සේවා සැලසීමෙන් හෝ ඒ සේවා සැලසීම හා සම්බන්ධයෙන් සැපයූ ද්‍රව්‍ය සැපයීමෙන් එක් මාසයක කාලයක් ඇතුළත ඒ කඩ කිරීමට විරුද්ධව ලියවිල්ලකින් අධිකාරිය වෙත පැමිණිල්ලක් කරනු ලැබිය හැකි ය.

(4) (3) වන උපවගන්තිය යටතේ කරන ලද පැමිණිල්ලක් සම්බන්ධයෙන් පවත්වනු ලබන යම් පරීක්ෂණයක දී පැමිණිල්ල කරනු ලැබ ඇත්තේ කවර වෙළෙන්දකුට හෝ වෙනත් තැනැත්තකුට විරුද්ධව ද ඒ වෙළෙන්දාට හෝ වෙනත් තැනැත්තාට, පුද්ගලිකවම හෝ නියෝජිතයකු මගින් තත්කාර්ය සම්බන්ධයෙන් සවන් දෙනු ලැබීමට අවස්ථාවක් ලබාදිය යුතු ය.

(5) පරීක්ෂණයෙන් අදාළ ව්‍යංජිත ප්‍රතිඥාහාරයක් කඩවීමක් සිදුව ඇති බව අධිකාරියේ මතය වන අවස්ථාවක, නියෝගයේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි කාලය ඇතුළත අගතියට පත් පාර්ශ්වයට වන්දි ගෙවන ලෙස හෝ අවස්ථාවෝචිත පරිදි ඒ භාණ්ඩ සැපයීම හෝ ඒ සේවා සැලසීම සඳහා සහ ඒ සේවාව සැලසීම හා සම්බන්ධයෙන් සැපයූ ද්‍රව්‍ය සැපයීම සඳහා ගෙවන ලද මුදල ආපසු ගෙවන ලෙස හෝ අධිකාරිය විසින් වෙළෙන්දාට හෝ වෙනත් තැනැත්තාට නියම කරනු ලැබිය යුතු ය.

(6) (5) වන උපවගන්තිය යටතේ වූ නියමයක් ලිඛිතව කරනු ලැබිය යුතු අතර, ඒ වෙළෙන්දාට හෝ වෙනත් තැනැත්තාට ලියාපදිංචි තැපෑලෙන් ඒ බව දැනුම් දෙනු ලැබිය යුතු ය.

(7) (5) වන උපවගන්තිය යටතේ නියමයක් කරන ලද්දේ කවර වෙළෙන්දකුට හෝ වෙනත් යම් තැනැත්තකුට විරුද්ධව ද ඒ වෙළෙන්දා හෝ වෙනත් යම් තැනැත්තා විසින් නියමයේ නිශ්චිතව සඳහන් කරන ලද කාලය ඇතුළත අවස්ථාවෝචිත පරිදි, ඒ වන්දි මුදල හෝ ගෙවීම හෝ ආපසු ගෙවීමට නියම කරන ලද මුදල ගෙවීම් පැහැර හරින හෝ ප්‍රතික්ෂේප කරන

හෝ අවස්ථාවක, නියමය කරන ලද්දේ කවර වෙළෙන්දකුට හෝ වෙනත් යම් තැනැත්තකුට විරුද්ධව ද ඒ වෙළෙන්දාගේ හෝ වෙනත් යම් තැනැත්තාගේ ව්‍යාපාරික හෝ පෞද්ගලික ස්ථානය අරබයා නිසි අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත් අධිකරණය වෙත අධිකාරිය විසින් තත් කාර්යය සඳහා කරන ලද ඉල්ලීමක් මත, ඒ මුදල, ඒ අධිකරණය විසින් ස්වකීය සාමාන්‍ය අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී පැනවිය හැකි දඩ මුදලකට වැඩි වූයේ වුව ද, ඒ අධිකරණය විසින් පනවන ලද දඩයක ආකාරයෙන් අයකර ගත යුතු ය.

පොදු කාර්යක්ෂමතා වාර්තා.

**33.** අමාත්‍යවරයාගේ ඉල්ලීම පිට අධිකාරිය විසින් රාජ්‍ය අංශයේ හා පෞද්ගලික අංශයේ කාර්යක්ෂමතාව පිළිබඳ අධ්‍යයනයක් කර අමාත්‍යවරයාට වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය. ඒ වාර්තාව පාර්ලිමේන්තුව ඉදිරියේ තැබීම අමාත්‍යවරයාගේ කාර්යය විය යුතු ය.

## III වන කොටස

## තරගකාරිත්වය සහ පාරිභෝගික සම්බන්ධතා ප්‍රවර්ධනය

තරග විරෝධී චර්යා සම්බන්ධයෙන් අධිකාරිය විසින් විමර්ශන පැවැත්විය යුතු බව.

**34.** (1) අධිකාරිය විසින් සිය මෙහෙයවීමෙන් ම හෝ යම් තැනැත්තකු හෝ යම් පාරිභෝගික සංවිධානයක හෝ යම් වෙළෙන්දන්ගේ සංගමයක් විසින් එය වෙත කරන ලද පැමිණිල්ලක් හෝ ඉල්ලීමක් මත, තරග විරෝධී චර්යාවක ප්‍රචලිතව පැවතීම සම්බන්ධයෙන් විමර්ශනයක් කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ විමර්ශනයක් එය ආරම්භ කිරීමෙන් දින සියයක් ඇතුළත දී සම්පූර්ණ කිරීම අධිකාරියේ කාර්ය විය යුතු ය.

තරග විරෝධී චර්යා.

**35.** යම් තැනැත්තකු ස්වකීය ව්‍යාපාර ක්‍රියාවලියේ දී අනුගමනය කරන ක්‍රියා කලාපය තනිව ගත් කල හෝ ඔහු හා සම්බන්ධ තැනැත්තන් විසින් අනුගමනය කරනු ලබන ක්‍රියා කලාපය සමඟ ගත් කල හෝ ශ්‍රී ලංකාව තුළ භාණ්ඩ නිෂ්පාදනය, සැපයීම හෝ අත්කර ගැනීම හෝ ශ්‍රී ලංකාව තුළ සේවා සැපයීම හෝ ලබාගැනීම සම්බන්ධයෙන් වූ තරගය සීමා කිරීමේ, විකෘති කිරීමේ හෝ වැළැක්වීමේ ප්‍රතිඵලය ගෙන දෙන, ගෙන දීමට අදහස් කරන ලද හෝ ගෙන දීමට ඉඩ ඇති ක්‍රියා කලාපයක් අනුගමනය කරන අවස්ථාවක, 34 වන වගන්තියේ කාර්යය සඳහා තරග විරෝධී චර්යාවක් පවතින ලෙස සැලකිය යුතු ය.

**36.** (1) 34 වන වගන්තිය යටතේ අධිකාරිය විසින් පවත්වනු ලබන විමර්ශනයක විෂය කාරණය සැදෙන්නා වූ කරුණක් සම්බන්ධයෙන් සම්බන්ධතාවක් දක්වන්නා වූ පාරිභෝගික සංගම්වල හෝ සංවිධානවල නියෝජිතයන් ද ඇතුළුව සියලු තැනැත්තන් වෙත, අධිකාරිය විසින් සවන් දෙනු ලැබීමේ සහ අධිකාරියේ මතය අනුව ඒ කාරණයට අදාළ වන වාචික හෝ ලේඛනමය සාක්ෂි ඉදිරිපත් කිරීමේ අවස්ථාවක් ලබා දිය යුතු ය.

34 වන වගන්තිය යටතේ විමර්ශනයකට අදාළ විධිවිධාන.

(2) 34 වන වගන්තිය යටතේ යම් විමර්ශනයක් පැවැත්වීමේ කාර්ය සඳහා අධිකාරියට පහත සඳහන් කරුණු පිළිබඳව දිසා අධිකරණයකට ඇති සියලුම බලතල ඇත්තේ ය :-

(අ) දැන්වීම් නිකුත් කිරීමේ සහ යම් සාක්ෂිකරුවකු පැමිණිය යුතු යයි නියම කිරීම :

(ආ) ලේඛන හෝ වාර්තා ඉදිරිපත් කරන ලෙස නියම කිරීම : සහ

(ඇ) යම් සාක්ෂිකරුවකු ලවා යම් දිවුරුමක් හෝ ප්‍රතිඥාවක් කරවීම.

(3) යම් තැනැත්තකු විසින්,-

(අ) විමර්ශනයක් පවත්වන අතරතුර දී හෝ පවත්වා අවසාන වීමෙන් පසුව සැහෙන හේතුවක් නොමැතිව අධිකාරිය හෝ එහි යම් සාමාජිකයකු අපකීර්තියට පත් කරන යම් ප්‍රකාශයක් පළකරන ලද හෝ යම් දෙයක් කරන ලද අවස්ථාවක ; හෝ

(ආ) අධිකාරියේ නීත්‍යානුකූල ක්‍රියාවලියට බාධා පමුණුවන ලද අවස්ථාවක ; හෝ

(ඇ) විමර්ශනයක් පවත්වන අතරතුර දී-

(i) අධිකාරිය විසින් ඒ තැනැත්තාට නිකුත් කරන ලද යම් දැන්වීමක දැක්වෙන වේලාවේ දී සහ ස්ථානයේ දී අධිකාරිය ඉදිරියේ පෙනී සිටීම, හේතුවක් නොමැතිව පැහැර හරින ලද අවස්ථාවක ; හෝ

(ii) දිවුරුම්දීම හෝ සහතික වීම ප්‍රතික්ෂේප කරන ලද හෝ යථාපරිදි දිවුරවනු ලැබ හෝ සහතික වී, අධිකාරිය විසින් විමර්ශනය කරනු ලබන කාරණා සම්බන්ධයෙන් ඔහුගෙන් අසන ලද යම් ප්‍රශ්නවලට පිළිතුරු දීම, හේතුවක් නොමැතිව ප්‍රතික්ෂේප කරන ලද හෝ පැහැර හරින ලද අවස්ථාවක ; හෝ

(iii) තම සන්තකයෙහි හෝ පාලනය යටතේ තිබෙන්නා වූ ද, අධිකාරිය විසින් විමර්ශනය කරනු ලබන කාරණයකට අධිකාරියේ මතය අනුව අදාළ වන්නා වූ ද යම් ලේඛනයක් හෝ වාර්තාවක් අධිකාරිය වෙත ඉදිරිපත් කර පෙන්වීම, හේතුවක් නොමැතිව ප්‍රතික්ෂේප කරන ලද හෝ පැහැර හරින ලද අවස්ථාවක,

ඒ තැනැත්තා අධිකාරියේ අධිකාරයට අගෞරව කිරීමේ හෝ අපහාස කිරීමේ වරදකට වරදකරු විය යුතු අතර, ඒ වරදට අභියාචනාධිකරණය විසින් දඬුවම් කරනු ලැබිය යුතු ය.

(4) යම් තැනැත්තකු අධිකාරියේ අධිකාරයට අගෞරව කිරීමේ හෝ අපහාස කිරීමේ වරද කර ඇතැයි අධිකාරිය විසින් නිශ්චය කරන ලද අවස්ථාවක, අධිකාරිය විසින්, ස්වකීය අධ්‍යක්ෂ ජනරාල්වරයා ලවා අධිකාරියේ නිශ්චය දක්වන සහතිකයක් අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් කිරීමට සැලැස්විය හැකි ය. එවැනි සෑම සහතිකයක් ම අධිකාරියේ සභාපතිවරයා විසින් අත්සන් කළ යුතු ය.

(5) (3) වන උපවගන්තියෙහි විධිවිධාන සලස්වනු ලැබ ඇති පරිදි සංජානනය කිරීම සුදුසු යයි අභියාචනාධිකරණය කල්පනා කරන අපහාස වරදක් පිළිබඳව දඬුවම් පැමිණවීම සඳහා පවත්වනු ලබන යම් නඩු කටයුත්තක දී, (4) වන උපවගන්තිය යටතේ අත්සන් කරනු ලැබ අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද සහතිකයක් ලෙස සැලකෙන යම් ලේඛනයක් එහි දක්වා ඇති නිශ්චයෙහි සඳහන් කාරුණු පිළිබඳ බැලූ බැල්මට පෙනෙන සාක්ෂි විය යුතු අතර එම නිශ්චය කිරීම අධිකාරිය විසින් කරන ලද බවට තීරණාත්මක සාක්ෂියක් විය යුතු ය.

අධිකාරිය විසින් සභාව වෙත ඉල්ලීමක් කළ යුතු බව.

**37.** (1) 34 වන වගන්තිය යටතේ පැවැත්වූ විමර්ශනයක් නිම වූ පසු අධිකාරිය විසින් එම කාරණාව නිශ්චය කිරීමේ කාර්යය සඳහා සභාව වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් ඉල්ලීම ලියවිල්ලකින් කරනු ලැබිය යුතු අතර, එය තත්කාර්ය සඳහා නියම කරනු ලැබිය හැකි ආකෘතියකින් විය යුතු ය.

යම් තැනැත්තකු හෝ වෙළෙන්දන්ගේ සංගමයක් විසින් කරනු ලබන ඉල්ලීම් සභාව විසින් භාරගත යුතු බව.

**38.** 34 වන වගන්තිය යටතේ අධිකාරිය විසින් විමර්ශනයක් අවසන් කිරීමෙන් පසු, ඒ විමර්ශනය සම්බන්ධයෙන් 37 වන වගන්තිය යටතේ ඉල්ලීමක් සභාව වෙත නොකිරීමට අධිකාරිය තීරණය කරන අවස්ථාවක, ඒ විමර්ශනය කරන ලද්දේ අවස්ථාවෝචිත පරිදි කවර තැනැත්තකුගේ, යම් පාරිභෝගික සංවිධානයක හෝ වෙළෙන්දන්ගේ සංගමයක පැමිණිල්ලක් හෝ ඉල්ලීමක් මත ද ඒ තැනැත්තා, පාරිභෝගික සංවිධානය හෝ වෙළෙන්දන්ගේ සංගමය විසින්, සභාව වෙත ලියවිල්ලකින් කරනු ලබන ඉල්ලීමක් මගින්–

(අ) අධිකාරිය විසින් කරන ලද විමර්ශනයේ වාර්තාව සභාව වෙත ඉදිරිපත් කරන ලෙස අධිකාරියට නියම කරන ලෙසත් ; සහ

(ආ) විනිශ්චය කිරීම සඳහා සභාව විසින් ඒ ඉල්ලීම සලකා බැලීමට අවශ්‍ය කරන්නා වූ ප්‍රමාණවත් කාරණා ඒ වාර්තාවේ තිබෙන බව සභාවේ මතය වූ අවස්ථාවක, ඒ ඉල්ලීම අසා තීරණය කරන ලෙසත්,

සභාවෙන් ඉල්ලා සිටිනු ලැබිය හැකි ය.

## IV වන කොටස

### පාරිභෝගික කටයුතු පිළිබඳ සභාව

පාරිභෝගික කටයුතු පිළිබඳ සභාවක් පිහිටුවීම සහ එහි සංයුතිය.

**39.** (1) මේ පනතේ කාර්යය සඳහා "පාරිභෝගික කටයුතු පිළිබඳ සභාව" යනුවෙන් හඳුන්වනු ලබන සභාවක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු පහත සඳහන් තැනැත්තන්ගෙන් සභාව සමන්විත විය යුතු ය –

(අ) වාණිජ නීති ක්ෂේත්‍රයෙහි පුළුල් පළපුරුද්දක් ඇති තැනැත්තකුගෙන් ;

(ආ) ව්‍යාපාරික ව්‍යවසාය කළමනාකරණයෙහි පුළුල් පළපුරුද්දක් ඇති තැනැත්තකුගෙන් ; සහ

(ඇ) වෙළෙඳ පිළිවෙත් හා පාරිභෝගික කටයුතුවල පුළුල් පළපුරුද්දක් ඇති අර්ථ ශාස්ත්‍රඥයකුගෙන්.

(3) සභාවේ සාමාජිකයන් අවුරුදු තුනක කාලයක් ධූර දැරිය යුතු අතර, සාමාජිකයන් අතුරින් එක් අයකු එහි සභාපති වශයෙන් අමාත්‍යවරයා විසින් නම් කළ යුතු ය.

(4) මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන පාරිශ්‍රමික සභාවේ සාමාජිකයන්ට ගෙවනු ලැබිය යුතු ය.

(5) සභාවේ ලේකම්වරයකු පත් කරනු ලැබිය යුතු අතර, ඔහු, සභාවේ සියලු කටයුතුවල වාර්තා තබා ගැනීම ද, සභාව විසින් යැවිය යුතු යයි මේ පනත යටතේ නියම කරනු ලැබ ඇති යම් දැන්වීම් යැවීම ද සම්බන්ධයෙන් වගකීම දරන්නේ ය.

සභාවේ කර්තව්‍ය.

**40.** (1) මේ පනත යටතේ සභාව වෙත යොමු කරනු ලබන සියලු ඉල්ලීම් හා යොමු කිරීම් අසා නිශ්චය කිරීම සභාවේ කර්තව්‍ය විය යුතු ය.

(2) සභාවේ තීරණයක් ඒකමතික නොවන්නා වූ අවස්ථාවක, සාමාජික බහුතරයේ තීරණයක්, සභාවේ තීරණයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

සභාව විසින් කළ යුතු නියමය.

**41.** (1) අවස්ථාවෝචිත පරිදි 37 වන වගන්තිය යටතේ හෝ 38 වන වගන්තිය යටතේ ඉල්ලීමක් කරනු ලැබ,—

(අ) යම් තරඟ විරෝධී චර්යාවක් පවතින නමුත් ඒ තරඟ විරෝධී චර්යාව මහජන යහපතට පටහැනිව ක්‍රියාත්මක නොවන බවට හෝ ක්‍රියාත්මක වීමට අවකාශ නොමැති බවට සභාව සෑහීමට පත් වූ අවස්ථාවක, සභාව විසින් ඒ සම්බන්ධයෙන් කරනු ලබන නියමයක් මඟින්, ඒ තරඟ විරෝධී චර්යාව සම්බන්ධයෙන් බලය දිය හැකි ය ; නැතහොත්

(ආ) යම් තරඟ විරෝධී චර්යාවක් පවතින බව සහ එය මහජන යහපතට පටහැනිව ක්‍රියාත්මක වන බවට සභාව සෑහීමට පත් වූ අවස්ථාවක, සභාව විසින් ඒ

සම්බන්ධයෙන් කරනු ලබන නියමයක් මගින් පහත සඳහන් කරුණු සඳහා විධිවිධාන සලස්වනු ලැබිය යුතු ය :-

(i) නියමයේ නිශ්චිතව සඳහන් කරනු ලබන ආකාරයකින් එම තරඟ විරෝධී චර්යාව අවසාන කිරීම ; සහ

(ii) යම් තරඟ විරෝධී චර්යාවකින් ඇති වන අහිතකර ප්‍රතිඵල වැළැක්වීමේ හෝ ඊට පිළියම් යෙදීමේ කාර්යය සඳහා අවශ්‍ය යයි සභාව අදහස් කරන වෙනත් යම් ක්‍රියා මාර්ගයක් ගැනීම.

(2) යම් තරඟ විරෝධී චර්යාවක් මහජන යහපතට පටහැනිව ක්‍රියාත්මක වන්නේ ද යන බව හෝ ක්‍රියාත්මක වීමට අවකාශ ඇත්තේ ද යන බව මේ වගන්තියේ කාර්යය සඳහා නිශ්චය කිරීමේ දී, සභාව විසින් විමර්ශනයට භාජනය වී ඇති කාරණයට අදාළ යයි සභාවට පෙනී යන සියලු කරුණු සලකා බැලිය යුතු අතර, –

(අ) භාණ්ඩ සපයන සහ සේවාවන් සලසන තැනැත්තන් අතර ඵලදායී තරඟයක් පවත්වාගෙන යාමේ හා ප්‍රවර්ධනය කිරීමේ ;

(ආ) ශ්‍රී ලංකාව තුළ දී සපයනු ලබන භාණ්ඩවල හා සලස්වනු ලබන සේවාවල මිල හා තත්ත්වය සම්බන්ධයෙන් ද, විවිධත්වය සම්බන්ධයෙන් ද ඒවා පරිභෝජනය කරන්නන්ගේ, මිල දී ගන්නන්ගේ හා වෙනත් පරිහරණය කරන්නන්ගේ සම්බන්ධතා ප්‍රවර්ධනය කිරීමේ ; සහ

(ඇ) තරඟකාරිත්වය මගින් පිරිවැය අඩුකිරීම, නව ශිල්පීය ක්‍රම හා නිෂ්පාදන වැඩිදියුණු කිරීම සහ භාවිත කිරීම ප්‍රවර්ධනය කිරීම ද පවත්නා වෙළෙඳපොළවලට අලුත් තරඟකරුවන් පිවිසීම පහසු කරලීමේ

යෝග්‍යතාව පිළිබඳ විශේෂ සැලකිල්ලක් දැක්විය යුතු ය.

(3) අවස්ථාවෝචිත පරිදි, 37 හෝ 38 වන වගන්ති යටතේ සභාව වෙත ඉල්ලීමක් කරනු ලැබූ අවස්ථාවක දී, ඒ ඉල්ලීම ලැබීමෙන් මාසයක් ඇතුළත, ඒ සම්බන්ධයෙන් නියමයක් කරනු ලැබීම සභාවේ කාර්ය විය යුතු ය.

41 වන වගන්තිය යටතේ වූ නියමයක් පළ කිරීම.

**42.** සභාව විසින් 41 වන වගන්තිය යටතේ කරන ලද යම් නියමයක් අධිකාරිය විසින් සුදුසු යයි අදහස් කරන යම් ආකාරයකින් පළ කිරීමට සලස්වනු ලැබිය හැකි ය.

සාක්ෂිකරුවන් වෙත දැන්වීම් නිකුත් කිරීමේ බලය.

**43.** (1) සභාව විසින් පවත්වනු ලබන යම් පරීක්ෂණයක දී හෝ විමර්ශනයක දී සාක්ෂිකරුවන් වෙත දැන්වීම් නිකුත් කිරීමේ හා ඔවුන් විභාග කිරීමේ බලය සභාවට ඇත්තේ ය. සෑම දැන්වීමක් ම සභාවේ ලේකම්වරයාගේ අත්සන යටතේ විය යුතු ය.

(2) දැන්වීමක් ඒ දැන්වීමේ නම් කර ඇති තැනැත්තා වෙත භාර කිරීමෙන් හෝ එය ප්‍රායෝගික නොවේ නම් ඒ තැනැත්තාගේ අවසන් වරට දන්නා පදිංචි ස්ථානයෙහි තැබීමෙන් නිකුත් කරනු ලැබිය හැකි ය.

(3) දැන්වීමක් නිකුත් කරනු ලැබ ඇති සෑම තැනැත්තෙකු ම එහි සඳහන් කර ඇති වේලාවේ දී සහ ස්ථානයේ දී සභාව ඉදිරිපිටට පැමිණ සිටිය යුතු අතර, දැන්වීමේ ස්වභාවය අනුව, සාක්ෂි දීම හෝ ඔහුට නියම කරනු ලබන පරිදි ඔහු සන්තකයේ හෝ බලය ඇතුළත වූ ලේඛන, වාර්තා හෝ වෙනත් දේවල් ඉදිරිපත් කිරීම හෝ කළ යුතු ය.

සාක්ෂි.

**44.** (1) මේ පනත යටතේ යම් පරීක්ෂණයක හෝ විමර්ශනයක කාර්ය සඳහා –

(අ) සපයා ගැනීමට, ලබා ගැනීමට හෝ පරීක්ෂා කිරීමට අවශ්‍ය හෝ යෝග්‍ය යයි එය විසින් අදහස් කරන ලිඛිත හෝ වාචික සියලු සාක්ෂි සපයා ගැනීමට හෝ ලබාගැනීමට සහ අවශ්‍ය හෝ යෝග්‍ය යයි එය විසින් අදහස් කරන සාක්ෂිකරුවන් වශයෙන් වූ සියලු තැනැත්තන් පරීක්ෂා කර බැලීම් පිණිස ; සහ

(ආ) යම් සාක්ෂිකරුවකුගේ ලිඛිත වූව ද නැතහොත් වාචික වූව ද සාක්ෂි, දිවුරුම හෝ ප්‍රතිඥා දීම ඒ සාක්ෂිකරු අධිකරණයක සාක්ෂි දෙන්නේ නම්, ඒ සාක්ෂිකරු විසින් දිය යුතු දිවුරුමක් හෝ ප්‍රතිඥාවක් විය යුතු දිවුරුම පිට හෝ ප්‍රතිඥාව පිට දෙන ලෙස නියම කිරීමට සහ එවැනි සෑම සාක්ෂිකරුවකුගෙන්ම දිවුරුම හෝ ප්‍රතිඥාව ලබාගැනීම පිණිස,

සභාවට බලය තිබිය යුතු ය.

(2) මේ පනත යටතේ කාර්ය පරිපාටියක් පවත්වාගෙන යාමේ දී, සභාව සාක්ෂි ආඥාපනතේ විධිවිධාන කිසිවකින් බැඳී නොසිටිය යුතු ය.

**45.** 43 වන වගන්තිය යටතේ දැනුම්දීම නිකුත් කරනු ලැබ ඇත්තේ යම් තැනැත්තකු වෙත ද, ඒ තැනැත්තා –

නිකුත් කරන ලද දැනුම්දීමකට අවනතවීම හෝ සාක්ෂිදීම පැහැර හැරීම.

(අ) දැන්වීමේ සඳහන් වේලාවේ දී හා ස්ථානයේ දී සභාව හමුවේ පෙනී සිටීම, යුක්තිසහගත යයි සභාවේ මතය වන හේතුවකින් තොරව පැහැර හැරියහොත් ;

(ආ) දිවුරුම් දීම හෝ ප්‍රතිඥා දීම ප්‍රතික්ෂේප කළහොත් හෝ යථා පරිදි දිවුරවීමෙන් හෝ ප්‍රතිඥා ගැනීමෙන් පසුව සභාව විසින් පරීක්ෂා කරන හෝ විමර්ශන කරන කාරණා හා සම්බන්ධයෙන් අසනු ලබන යම් ප්‍රශ්නයකට පිළිතුරු දීම, යුක්තිසහගත යයි සභාවේ මතය වන හේතුවකින් තොරව ප්‍රතික්ෂේප කළහොත් හෝ පැහැර හැරියහොත් ; හෝ

(ඇ) ඔහු සන්තකයේ හෝ ඔහුගේ බලය යටතේ ඇත්තා වූ ද සභාවේ මතය අනුව, පරීක්ෂණය කරන හෝ විමර්ශනය කරන කාරණාවල සත්‍යතාව දැනගැනීම සඳහා අවශ්‍ය වන්නා වූ ද යම් ලේඛනයක් හෝ වෙනත් දෙයක් සභාව වෙත ඉදිරිපත් කිරීම, යුක්තිසහගත යයි සභාවේ මතය වන හේතුවකින් තොරව ප්‍රතික්ෂේප කළහොත් හෝ පැහැර හැරියහොත්

ඒ තැනැත්තා සභාවට අපහාස කිරීමේ හෝ සභාවට අගරු කිරීමේ වරදට වරදකරු වන්නේ ය.

**46.** (1) 45 වන වගන්තියේ විධිවිධාන උල්ලංඝනය වන යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් අභියාචනාධිකරණය හා සම්බන්ධව කරන ලද නම් ඒ ක්‍රියාවෙන් හෝ නොකර හැරීමෙන් ඒ අධිකරණයට හෝ ඒ අධිකරණයේ අධිකාරයට, අපහාස කිරීමේ හෝ අගරු කිරීමේ වරදක් සංයුක්ත වේ ද, ඒ ක්‍රියාවෙන් සභාවට අපහාස කිරීමේ හෝ අගරු කිරීමේ වරදක් සංයුක්ත වන්නේ ය.

අපහාස කිරීමේ වරදට දඬුවම.

(2) යම් තැනැත්තකු විසින්, සභාවට හෝ එහි අධිකාරයට අපහාස කිරීමේ හෝ අගරු කිරීමේ වරදක් කර ඇතැයි සභාව විසින් තීරණය කරනු ලබන අවස්ථාවක, එම තීරණය දැක්වෙන සහතිකයක්, සභාපතිවරයා ලවා අභියාචනාධිකරණය වෙත

යැවීමට සභාව විසින් කටයුතු සලස්වනු ලැබිය හැකි ය. ඒ සෑම සහතිකයක් ම සභාවේ සභාපතිවරයා විසින් අත්සන් කරනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදි සංශෝධනවලට යෝග්‍ය යයි අභියාචනාධිකරණය විසින් සලකනු ලැබිය හැකි යම් අපහාස වරදක් සම්බන්ධයෙන් දඬුවම් කිරීම සඳහා වන යම් නඩු කටයුත්තක දී, (2) වන උපවගන්තිය යටතේ අත්සන් තබා අධිකරණය වෙත එවන ලද සහතිකයක් බවට උද්දේශිත යම් ලේඛනයක් :-

(අ) එය එවැනි සහතිකයක් නොවන බව ඔප්පු කරනු ලැබුවහොත් මිස, වැඩිදුර ඔප්පු කිරීමකින් තොරව, සාක්ෂි වශයෙන් භාරගත යුතු අතර, එය එවැනි සහතිකයක් ලෙස සැලකිය යුතු ය ; තව ද

(ආ) එම නිශ්චයේ ප්‍රකාශිත කරුණු මත සභාව විසින්, සහතිකයේ දැක්වෙන නිශ්චයට එළඹුණු බවට සාක්ෂියක් විය යුතු ය.

(4) සභාවට විරුද්ධව සිදු වී ඇතැයි කියන අපහාස වරදක් හෝ සභාවට අගරු කිරීමේ වරදක් සම්බන්ධයෙන් දඬුවම් කිරීම සඳහා වන මේ වගන්තියේ විධිවිධාන සලස්වා ඇති පරිදි වූ යම් නඩු කටයුත්තක දී, සභාවේ යම් සාමාජිකයකු සාක්ෂිකරුවකු ලෙස කැඳවනු ලැබිය හැකි ය ; නැතහොත්, විභාග කරනු ලැබිය හැකි ය. එසේ ම යම් නඩු කටයුත්තක් (2) වන උපවගන්තියේ සඳහන් සහතිකය ලැබී මාස තුනක් ඇතුළත විභාග කොට සුදුස්සක් කරනු ලැබිය යුතු ය.

සාක්ෂිකරුවන්ගේ වරප්‍රසාද.

**47.** අධිකරණයක් ඉදිරියේ සාක්ෂි දෙන යම් තැනැත්තකු විසින් ඒ අධිකරණය ඉදිරියේ දෙන ලද සාක්ෂි වෙනුවෙන්, යම් වරප්‍රසාද ඔහුට හිමිවේ ද, ඒ සියලු වරප්‍රසාද සභාව ඉදිරිපිට සාක්ෂි දෙන සෑම තැනැත්තකුට ම, ඒ සාක්ෂි වෙනුවෙන් හිමි විය යුතු ය.

කාර්ය පටිපාටිය සභාව විසින් තීරණය කරනු ලැබිය යුතු බව.

**48.** සභාව ඉදිරියේ දී පැවැත්වෙන යම් පරීක්ෂණයක දී හෝ විමර්ශනයක දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි ය.

## V වන කොටස

### අධිකාරියේ අරමුදල

**49.** (1) අධිකාරියට එහිම අරමුදලක් තිබිය යුතු ය. අධිකාරියේ අරමුදල.

(2) අධිකාරියේ අරමුදලට පහත සඳහන් මුදල් ගෙවනු ලැබිය යුතු ය :–

(අ) අධිකාරියේ ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව විසින් වරින් වර සම්මත කරනු ලැබිය හැකි සියලු මුදල් ප්‍රමාණයන් ;

(ආ) අධිකාරිය විසින් ස්වකීය කර්තව්‍ය ඉටු කිරීමේ දී ගාස්තු වශයෙන් හෝ අන්‍යාකාරයකින් අධිකාරියට ලැබිය හැකි සියලු මුදල් ප්‍රමාණයන් ;

(ඇ) මේ පනත යටතේ රජය සන්තක කරනු ලබන යම් භාණ්ඩ කිසිවක් විකිණීමෙන් ලැබෙන මුදල් ප්‍රමාණයන් ;

(ඈ) මේ පනත යටතේ සිදුකරන යම් වරදක් සඳහා පනවන ලද සෑම දඩ මුදලකින්ම භාගයෙන් එකක මුදල් ප්‍රමාණයන් ;

(ඉ) ප්‍රදාන හෝ පරිත්‍යාග වශයෙන් අධිකාරියට ලබාදෙනු ලබන සියලු මුදල් ප්‍රමාණයන් ;

(ඊ) 59 වන වගන්තිය හෝ 73 වන වගන්තිය යටතේ අරමුදලට බැර කරනු ලබන හෝ මාරු කරනු ලබන සියලු මුදල් ප්‍රමාණයන්.

(3) පහත සඳහන් මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය :–

(අ) අධිකාරියේ සහ සභාවේ සාමාජිකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික ;

(ආ) පාරිභෝගිකයන්ගේ සංවිධාන ප්‍රවර්ධනය කිරීම, ඒවාට සහාය වීම සහ ඒවා දිරි ගැන්වීම පිණිස සහ එවැනි සංවිධාන පරිපාලනය හා වැඩිදියුණු කිරීම පිණිස අවශ්‍ය යයි අධිකාරිය විසින් සලකනු ලැබිය හැකි යම් මුදල් ප්‍රමාණයන් ;

(ඇ) පාරිභෝගික අධ්‍යාපනය සඳහා සහ ඒ හා සම්බන්ධ තොරතුරු ප්‍රචලිත කර හැරීම සඳහා සහ ඵලදායී අධ්‍යාපනය වැඩිදියුණු කිරීමට සම්බන්ධ හෝ ආනුෂංගික යම් කාර්යයක් සඳහා අවශ්‍ය යයි අධිකාරිය විසින් සලකනු ලැබිය හැකි යම් මුදල් ප්‍රමාණයක් ; සහ

(ඈ) මේ පනත යටතේ අධිකාරිය බලතල, කර්තව්‍ය හා කාර්ය ක්‍රියාත්මක කිරීමෙහි සහ ඉටු කිරීමෙහි ලා අධිකාරිය සහ සභාව විසින් දරනු ලබන වියදම් පියවීම සඳහා අවශ්‍ය විය හැකි යම් මුදල් ප්‍රමාණයක්.

මුදල් වර්ෂය සහ ගිණුම් විගණනය.

**50.** (1) අධිකාරියේ මුදල් වර්ෂය ලිත වර්ෂය විය යුතු ය.

(2) අධිකාරිය විසින්, අධිකාරියේ ආදායම හා වියදම්, වත්කම් හා බැරකම් සහ අධිකාරියේ වෙනත් සියලු ගනුදෙනු සම්බන්ධයෙන් නිසි ගිණුම් පොත් තබා ගැනීමට සැලැස්විය යුතු ය.

(3) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනයට සම්බන්ධ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන, අධිකාරියේ ගිණුම් විගණනය සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටස අදාළ වීම.

**51.** 1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටසේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අධිකාරියේ මුදල් පාලනය සහ ගිණුම් සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

## VI වන කොටස

### අධිකාරියේ කාර්ය මණ්ඩලය

අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා.

**52.** (1) අධිකාරිය විසින්, අමාත්‍යවරයාගේ ලියවිල්ලකින් දුන් අනුමතය ඇතිව, අධිකාරියට (මේ පනත යටතේ "අධ්‍යක්ෂ ජනරාල්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) අධ්‍යක්ෂ ජනරාල්වරයකු පත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරනු ලබන අධ්‍යක්ෂ ජනරාල්වරයා, අධිකාරියේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු අතර, සෑමවිටම, අධිකාරියේ විධාන යටතේ ක්‍රියා කළ යුතු ය.

(3) අධිකාරිය විසින්, අමාත්‍යවරයා විමසා නියම කරනු ලබන යම් පාරිශ්‍රමිකයක්, අධ්‍යක්ෂ ජනරාල්වරයාට ගෙවනු ලැබිය යුතු ය.

(4) රෝගාතුරවීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයාට ඔහුගේ ධුරයේ කාර්ය ඉටු කිරීමට නොහැකි වන අවස්ථාවක, අධිකාරිය විසින්, අමාත්‍යවරයාගේ ලියවිල්ලකින් වූ අනුමතය ඇතිව, අධ්‍යක්ෂ ජනරාල්වරයා නොමැති කාලය තුළ ඔහු වෙනුවෙන් වැඩ බැලීම සඳහා වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

**53.** අධිකාරියේ සහ සභාවේ කටයුතු කිරීම සඳහා අවශ්‍ය විය හැකි අධ්‍යක්ෂවරයන්, නියෝජ්‍ය අධ්‍යක්ෂවරයන්, සහකාර අධ්‍යක්ෂවරයන් සහ වෙනත් නිලධරයන්, සේවකයන් සහ උපදේශකයන් යම් සංඛ්‍යාවක් අධිකාරිය විසින් පත් කරනු ලැබිය හැකි අතර ඔවුන්ට අධිකාරිය විසින් අමාත්‍යවරයා විමසා තීරණය කරනු ලබන අනුපාතික අනුව පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු ය.

අධිකාරියට නිලධරයන්, සේවකයන් හා උපදේශකයන් පත් කිරීම.

**54.** (1) රජයේ සේවයේ නියුක්ත යම් නිලධරයකු, අධිකාරියේ ඉල්ලීම පිට, ඒ නිලධරයාගේ සහ රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ද කැමැත්ත ඇතිව අධිකාරිය විසින් එවැනිම කැමැත්ත ඇතිව නිශ්චය කරනු ලබන කාලසීමාවක් සඳහා, අධිකාරියේ කාර්ය මණ්ඩලය තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය ; නැතහොත්, එවැනිම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

අධිකාරියේ කාර්ය මණ්ඩලයට රජයේ නිලධරයන් පත් කිරීම.

(2) රජයේ සේවයේ නියුක්ත යම් නිලධරයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඒ නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) රජයේ සේවයේ නියුක්ත යම් නිලධරයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(4) නිශ්චිත කාලසීමාවක් ආණ්ඩුවට සේවය කිරීමට ගිවිසගෙන තිබෙන යම් තැනැත්තකු, අධිකාරිය විසින් සේවයේ යොදවා ගනු ලබන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් අධිකාරියට සේවය කරනු ලබන යම් කාලසීමාවක්, ඒ ගිවිසුම යටතේ ඒ තැනැත්තාගේ බැඳීම් ඉටු කිරීමේ කාර්ය සඳහා ආණ්ඩුවට කරනු ලබන සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

## VII වන කොටස

## පොදු විධිවිධාන

අධිකාරිය සතු අවවාද කිරීමේ බලතල.

**55.** (1) යම් තැනැත්තකු විසින් මේ පනතේ විධිවිධානයක් හෝ ඒ යටතේ දෙන ලද යම් විධානයක් උල්ලංඝනය කර ඇති බවට, අධිකාරිය විසින් අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි පරීක්ෂණවලින් පසුව අධිකාරිය සෑහීමට පත් වුවහොත්, මේ පනතේ පටහැනිව කවර විධිවිධානයක් තිබුණි ද, පළමු උල්ලංඝනයේ දී ඒ තැනැත්තාට, ලියවිල්ලක් මගින් අවවාදයක් කරනු ලැබීම අධිකාරියට කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ අවවාදයක් අධිකාරිය විසින්, ලියාපදිංචි තැපෑලෙන් යවනු ලැබිය යුතු ය.

වාර්තා පවත්වාගෙන යන ලෙස සහ වාර වාර්තා සපයන ලෙස නියම කිරීමේ බලය.

**56.** (1) අධිකාරිය විසින් ස්වකීය කර්තව්‍ය නිසි ලෙස ඉටු කිරීම සඳහා යම් භාණ්ඩයක් හෝ සේවාවක්, සාදන්නන්ට, ආනයනකරුවන්ට, බෙදාහරින්නන්ට හෝ අපනයනකරුවන්ට -

(අ) මේ පනත යටතේ ස්වකීය කර්තව්‍ය නිසිලෙස ඉටු කිරීම සඳහා අවශ්‍ය යයි අධිකාරිය සලකන යම් කාරණා සම්බන්ධයෙන් අධිකාරිය නිශ්චය කරනු ලබන යම් ආකෘතියක් අනුව වාර්තා පවත්වා ගෙන යන ලෙස ; සහ

(ආ) මේ පනත යටතේ ස්වකීය කර්තව්‍ය නිසිලෙස ඉටු කිරීම සඳහා අවශ්‍ය යයි අධිකාරිය සලකන යම් කාරණා සම්බන්ධයෙන්, අධිකාරිය නිශ්චය කරනු ලබන කාලසීමාවන් සහ ආකෘති අනුව වාර වාර්තා අධිකාරිය වෙත සපයන ලෙස,

නියම කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ පවත්වා ගෙන යාමට නියම් කරනු ලැබූ වාර්තා, අවුරුදු හයකට නොවැඩි කාලයක් සඳහා සංරක්ෂණය කිරීම, සියලුම සාදන්නන්, ආනයනකරුවන්, බෙදාහරින්නන් සහ අපනයනකරුවන්ගේම කාර්ය විය යුතු ය.

**57.** (1) අධිකාරිය විසින හෝ තත්කාර්යය සඳහා අධිකාරිය විසින් බලය දෙනු ලැබූ යම් තැනැත්තකු විසින් ලිඛිත දැන්වීමක් මගින්, යම් තැනැත්තකුට, මේ පනත යටතේ අධිකාරියේ කර්තව්‍ය නිසි පරිදි ඉටු කිරීම සඳහා අවශ්‍ය යයි අධිකාරිය සලකන, ඒ දැන්වීමේ නියම්විතව සඳහන් කරන යම් තොරතුරක් හෝ ලේඛනයක්, එහි සඳහන් කාලසීමාව ඇතුළත සපයන ලෙස හෝ ඉදිරිපත් කරන ලෙස නියම කරනු ලැබිය හැකි අතර, ඒ තොරතුරු අනාවරණය කිරීම හෝ ලේඛනය ඉදිරිපත් කිරීම ඒ දැන්වීම ලබන යම් තැනැත්තකුට තහනම් කෙරෙන යම් ලිඛිත නීතියක විධිවිධානවල කුමක් සඳහන්ව ඇත ද, ඒ දැන්වීමේ සඳහන් කාලය ඇතුළත ඒ නියමය අනුව කටයුතු කිරීම ඒ දැන්වීම ලබන තැනැත්තාගේ කාර්යය වන්නේ ය :

එසේ වුව ද, යම් තොරතුරක් අනාවරණය කිරීම හෝ යම් ලේඛනයක් ඉදිරිපත් කිරීම, යම් බද්දක් පැනවීම සහ අයකර ගැනීම සඳහා විධිවිධාන සැලැස්වෙන යම් නීතියක යම් විධිවිධානයකින් තහනම් කර ඇත්නම්, ඒ තොරතුර සපයන ලෙස හෝ ඒ ලේඛනය ඉදිරිපත් කරන ලෙස, ඒ තැනැත්තාට අධිකාරිය විසින් හෝ අධිකාරිය විසින් තත්කාර්යය සඳහා බලය දෙනු ලැබූ යම් තැනැත්තකු විසින් දැන්වීමක් මගින් නියම කිරීමට, මේ උපවගන්තියේ සඳහන් කිසිවකින් බලය දෙනැයි තේරුම් ගැනීම හා අර්ථ දැක්වීම නොකළ යුතු ය.

(2) 56 වන වගන්තිය යටතේ සපයන ලද වාර වාර්තාවක ඇතුළත් කිසිම තොරතුරක් හා මේ වගන්තිය යටතේ නිකුත් කරන ලද දැන්වීමක් ප්‍රකාර කටයුතු කිරීමෙහි ලා සපයන ලද කිසිම තොරතුරක් හෝ ඉදිරිපත් කරන ලද ලේඛනයක ඇතුළත් කරුණු, අවස්ථාවෝචිත පරිදි, ඒ වාර වාර්තාව හෝ තොරතුර සපයන හෝ ඒ ලේඛනය ඉදිරිපත් කරන තැනැත්තාගේ කැමැත්ත ඇතිව මිස, නැතහොත් අධිකාරියේ කර්තව්‍ය ඉටු කිරීමෙහි ලා මිස, අධිකාරිය විසින් පළ කිරීම හෝ වෙනත් යම් තැනැත්තකුට දැන්වීම හෝ නොකළ යුතු ය.

තොරතුරු සපයන ලෙස ඉල්ලීමට අධිකාරිය සතු බලය.

ඇතුළුවීමට, පරීක්ෂා කිරීමට සහ සෝදිසි කිරීමට ඇති බලය.

**58.** (1) මේ පනතේ විධිවිධාන හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ අනුව ක්‍රියා කරන්නේ ද යන්න නිසැකවම දැනගැනීමේ කාර්ය සඳහා, අධිකාරිය විසින් හෝ අධිකාරිය විසින් තත්කාර්යය සඳහා ලියවිල්ලකින් බලය පවරනු ලැබූ වෙන යම් නිලධරයකු විසින්, සාධාරණ හේතු මත සහ අවශ්‍ය වේ නම්, සවකීය අනන්‍යතාවය පිළිබඳ ඉදිරිපත් කිරීමෙන් පසු—

(අ) යම් සාදන්නකු හෝ වෙළෙන්දකු ඔහුගේ වෙළෙඳ ව්‍යාපාරය පවත්වා ගෙන යන පරිශ්‍රයකට හෝ වෙනත් යම් පරිශ්‍රයකට, දවසේ ඕනෑම යුක්තිසහගත වේලාවක දී ඇතුළු වීම, පරීක්ෂා කිරීම සහ සෝදිසි කිරීම :

(ආ) 16 වන හෝ 17 වන වගන්තියේ විධිවිධාන උල්ලංඝනය වන සේ ඒ පරිශ්‍රයේ තිබී සොයාගන්නා යම් භාණ්ඩයක් තහනමට ගැනීම හා රඳවා තබා ගැනීම ; සහ

(ඇ) මේ පනතින් හෝ වෙනත් යම් නීතියකින් හෝ ඒ යටතේ ඒ වෙළෙඳ ව්‍යාපාරය සම්බන්ධයෙන් පවත්වා ගෙන යා යුතු බවට නියම කර ඇති යම් වාර්තා හෝ ලේඛන පරීක්ෂා කිරීම, පිටපත් ලබාගැනීම හෝ තහනමට ගැනීම හා රඳවා තබාගැනීම,

කළ හැකි ය.

(2) (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ තහනමට ගෙන රඳවා තබාගනු ලැබූ යම් භාණ්ඩයක් අධිකරණයට ඉදිරිපත් කළ යුතු අතර, ඒ සාදන්නා හෝ වෙළෙන්ද වරදකරු කරනු ලැබූ විට ඒ භාණ්ඩය රාජසන්තක කර අධිකරණය විසින් තීරණය කරනු ලබන යම් ආකාරයකින් බැහැර කළ යුතු අතර ඉන් උපලබ්ධ වන මුදල් අධිකාරියේ අරමුදලට බැර කළ යුතු ය.

නරක්විය හැකි භාණ්ඩ විකිණීම.

**59.** (1) 58 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ තහනමට ගෙන රඳවා තබා ගත් යම් භාණ්ඩයක්, අධිකාරියේ මතය අනුව වහාම විකිණීම අවශ්‍ය වන්නා වූ හෝ විකිණීම නුවණට හුරු වන්නා වූ නරක් විය හැකි ස්වභාවයක තිබෙන අවස්ථාවක, විකිණීම පිළිබඳව දින තුනකට නොඅඩු දැනුම් දීමක් ශ්‍රී ලංකාවේ සංසරණය වන සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි ප්‍රවෘත්ති පත්‍රයක පළකිරීමෙන් පසු, ඒ භාණ්ඩය විකිණීමට අධිකාරිය විසින් කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් භාණ්ඩයක් විකිණීමෙන් ලත් මුදල්, ඒ කාර්ය සඳහා අධිකාරිය විසින් පවත්වා ගෙන යා යුතු විශේෂ ගිණුමකට බැර කළ යුතු අතර, භාණ්ඩය තහනමට

කරනු ලැබුයේ යම් තැනැත්තකුගෙන් ද, ඒ තැනැත්තා අධිකරණය විසින් නිදොස් කර නිදහස් කරනු ලැබුවහොත් හෝ ඒ භාණ්ඩය විකිණීමෙන් උපලබ්ධි වූ මුදල ඒ තැනැත්තාට දෙනු ලැබිය යුතු ය.

(3) භාණ්ඩ භාරගැනීමට ගන්නා ලද්දේ කවර තැනැත්තකුගෙන් ද ඒ තැනැත්තා අධිකරණය විසින් වරදකරු කරනු ලැබූ විට, ඒ භාණ්ඩය විකිණීමෙන් උපලබ්ධ වූ සහ (2) වන උපවගන්තියේ සඳහන් විශේෂ ගිණුමේ බැරව ඇත්තා වූ මුදල අධිකාරියේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

**60.** (1) (අ) (i) යම් භාර පාර්ශ්වයක් සපයන ලෙස අධිකාරිය විසින් 56 වන වගන්තිය යටතේ නියම කරනු ලැබූ විට, එය සැපයීම ; හෝ වැරදි සහ දඬුවම්.

(ii) යම් තොරතුරක් සපයන ලෙස හෝ යම් ලේඛනයක් ඉදිරිපත් කරන ලෙස 57 වන වගන්තිය යටතේ යැවූ දැන්වීමක් මගින් නියම කරනු ලැබූ විට, එය සැපයීම හෝ ඉදිරිපත් කිරීම,

පැහැර හරින හෝ ප්‍රතික්ෂේප කරන :

(ආ) මේ පනත යටතේ සපයන යම් භාර පාර්ශ්වයක දැනුවත්ව යම් අසත්‍ය ප්‍රකාශයක් කරන හෝ යම් තොරතුරක් සපයන ලෙස අධිකාරිය විසින් නියම කරන ලද විට, දැනුවත්ව යම් අසත්‍ය තොරතුරක් සපයන ; හෝ

(ඇ) 58 වන වගන්තිය යටතේ වූ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමෙහි ලා කටයුතු කරන යම් නිලධරයකුට බාධා කරන,

යම් තැනැත්තෙක් මේ පනත යටතේ වරදක් කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට,--

(i) ඒ තැනැත්තා සංස්ථාවක් නොවන අවස්ථාවක, පළමු වරදක සම්බන්ධයෙන් වන විට රුපියල් එක් දහසකට නොඅඩු හා රුපියල් පන් දහසකට නොවැඩි දඩයකට හෝ මාස තුනකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක

බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම සහ ඉන් පසුව සිදු කරන වරදක් සම්බන්ධයෙන් වන විට රුපියල් දෙදහසකට නොඅඩු හා රුපියල් දස දහසකට නොවැඩි දඩයකට හෝ මාස හයකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම; හෝ

(ii) ඒ තැනැත්තා සංස්ථාවක් වන විට, පළමු වරදක් සම්බන්ධයෙන් රුපියල් පන්දහසකට නොඅඩු හා රුපියල් දස දහසකට නොවැඩි දඩයකට සහ ඉන් පසුව සිදු කරන වරදක් සම්බන්ධයෙන් වන විට රුපියල් දස දහසකට නොඅඩු හා රුපියල් විසිදහසකට නොවැඩි දඩයකට,

හෝ යටත් වන්නේ ය.

(2) (අ) 41 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ කරන ලද නියමයක් අනුව කටයුතු කිරීම පැහැර හරින හෝ ප්‍රතික්ෂේප කරන හෝ ඒ නියමය උල්ලංඝනය වන පරිදි ක්‍රියා කරන, හෝ යම් තැනැත්තෙක් මේ පනත යටතේ වරදක් කරන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන සඳු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට –

(i) ඒ තැනැත්තා සංස්ථාවක් නොවන අවස්ථාවක, පළමු වරදක් සම්බන්ධයෙන් වන විට රුපියල් පන්දහසකට නොඅඩු හා රුපියල් පණස් දහසකට නොවැඩි දඩයකට හෝ අවුරුද්දකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම සහ ඉන් පසුව සිදු කරන වරදක් සම්බන්ධයෙන් වන විට රුපියල් දස දහසකට නොඅඩු හා රුපියල් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ අවුරුදු දෙකකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම ; හෝ

(ii) ඒ තැනැත්තා සංස්ථාවක් වන අවස්ථාවක, පළමු වරදක් සම්බන්ධයෙන් වන විට රුපියල් පණස් දහසකට නොඅඩු හා රුපියල් දස ලක්ෂයකට නොවැඩි දඩයකට සහ ඉන් පසුව සිදු කරන වරදක් සම්බන්ධයෙන් වන විට රුපියල් ලක්ෂයකට නොඅඩු හා රුපියල් දස ලක්ෂ දෙකකට නොවැඩි දඩයකට,

හෝ යටත් වන්නේ ය.

(ආ) 41 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ නියමයක් කර ඇත්තේ සවර ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ද ඒ ක්‍රියාකාරකම්වලින්, අධිකරණය විසින් නිශ්චය කරනු ලබන යම් කාලසීමාවක් සඳහා හෝ ඒ ඡේදය යටතේ කර ඇති නියමය අනුව ඒ තැනැත්තා කටයුතු කරන තුරු හෝ වළකින ලෙස අධිකරණය විසින් ඊට අමතරව ඒ තැනැත්තාට ආඥා කරනු ලැබිය හැකි ය.

(3) 15 වන වගන්තියේ හෝ 16 වන වගන්තියේ හෝ 17 වන වගන්තියේ විධිවිධාන කඩකිරීමේ හේතුවෙන් මේ පනත යටතේ වරදකට වරදකරු වූ යම් තැනැත්තකු මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට,–

(අ) ඒ තැනැත්තා සංස්ථාවක් නොවන අවස්ථාවක, පළමු වරදක් සම්බන්ධයෙන් වන විට, රුපියල් එක් දහසකට නොඅඩු හා රුපියල් දස දහසකට නොවැඩි දඩයකට හෝ මාස හයකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම සහ ඉන පසුව සිදු කරන වරදක් සම්බන්ධයෙන් වන විට, රුපියල් දෙදහසකට නොඅඩු හා රුපියල් විසිදහසකට නොවැඩි දඩයකට හෝ අවුරුදු එකකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම ; හෝ

(ආ) ඒ තැනැත්තා සංස්ථාවක් වන අවස්ථාවක, පළමු වරදක් සම්බන්ධයෙන් වන විට, රුපියල් දස දහසකට නොඅඩු හා රුපියල් පණස් දහසකට නොවැඩි දඩයකට සහ

ඉන් පසුව සිදු කරන වරදක් සම්බන්ධයෙන් වන විට, රුපියල් ලක්ෂයකට නොඅඩු සහ රුපියල් දෙලක්ෂයකට නොවැඩි දඩයකට,

හෝ යටත් වන්නේ ය.

(4) 18 වන වගන්තියේ විධිවිධාන කඩකිරීමේ හේතුවෙන් මේ පනත යටතේ වරදකට වරදකරු වන යම් තැනැත්තකු මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන නඩු විභාගයෙන් පසු වරදකරු කරනු ලැබූ විට,-

(අ) ඒ තැනැත්තා සංස්ථාවක් නොවන අවස්ථාවක, පළමු වරදක් සම්බන්ධයෙන් වන විට, රුපියල් පන් දහසකට නොඅඩු සහ රුපියල් පණස් දහසකට නොවැඩි දඩයකට හෝ අවුරුදු එකකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම සහ ඉන් පසුව සිදු කරන වරදක් සම්බන්ධයෙන් වන විට, රුපියල් දස දහසකට නොඅඩු හා රුපියල් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ අවුරුදු දෙකකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම. ; හෝ

(ආ) ඒ තැනැත්තා සංස්ථාවක් වන අවස්ථාවක පළමු වරදක් සම්බන්ධයෙන් වන විට, රුපියල් පණස් දහසකට නොඅඩු හා රුපියල් දශ ලක්ෂයකට නොවැඩි දඩයකට සහ ඉන් පසුව සිදු කරන වරදක් සම්බන්ධයෙන් වන විට, රුපියල් ලක්ෂයකට නොඅඩු හා රුපියල් දසලක්ෂ දෙකකට නොවැඩි දඩයකට ද,

යටත් වන්නේ ය.

(5) මේ පනතේ යම් විධිවිධානයක් හෝ (මේ වගන්තියේ (1) වන, (2) වන, (3) වන සහ (4) වන උපවගන්තිවල සඳහන් විධිවිධාන නොවන) එවැනි යම් විධිවිධානයක් යටතේ පනවන ලද නියම කිසිවක් හෝ 72 වන වගන්තිය යටතේ සාදන ලද නියෝග කිසිවක් කඩකරමින් ක්‍රියාකරන සෑම තැනැත්තකු ම මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට,-

(අ) ඒ තැනැත්තා සංස්ථාවක් නොවන අවස්ථාවක, පළමු වරදක් සම්බන්ධයෙන් වන විට, රුපියල් එක් දහසකට නොඅඩු හා රුපියල් දස දහසකට නොවැඩි දඩයකට හෝ මාස හයකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම සහ ඉන් පසුව සිදු කරන වරදක් සම්බන්ධයෙන් වන විට, රුපියල් දෙදහසකට නොඅඩු හා රුපියල් විසිදහසකට නොවැඩි දඩයකට හෝ අවුරුදු එකකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම ; හෝ

(ආ) ඒ තැනැත්තා සංස්ථාවක් වන අවස්ථාවක පළමු වරදක් සම්බන්ධයෙන් වන විට, රුපියල් දස දහසකට නොඅඩු හා රුපියල් එක් ලක්ෂයකට නොවැඩි දඩයකට සහ ඉන් පසුව සිදු කරන වරදක් සම්බන්ධයෙන් වන විට, රුපියල් විසිදහකට නොඅඩු හා රුපියල් දෙලක්ෂයකට නොවැඩි දඩයකට ද,

යටත් වන්නේ ය.

(6) මේ පනත යටතේ වරදකරු කරනු ලැබූ සියලු තැනැත්තන්ගේ නම් සහ ලිපිනයන් සුදුසු යයි අධිකාරිය සලකන යම් ආකාරයකින්, අධිකාරිය විසින් ප්‍රකාශයට පත් කිරීම හෝ ප්‍රකාශයට පත් කිරීමට සැලැස්වීම කරනු ලැබිය හැකි ය.

(7) පුද්ගල මණ්ඩලයක් විසින් මේ පනත යටතේ යම් වරදක් සිදු කරනු ලැබූ අවස්ථාවක –

(අ) පුද්ගල මණ්ඩලය සංස්ථාවක් වේ නම්, ඒ සංස්ථාවේ සෑම අධ්‍යක්ෂවරයකු හා නිලධරයකු ම ; සහ

(ආ) පුද්ගල මණ්ඩලය ව්‍යාපාරික ආයතනයක් නම් ඒ ව්‍යාපාරික ආයතනයේ සෑම හවුල්කරුවෙක් ම,

ඒ වරදට වරදකරු වන්නේ ය :

එසේ වුව ද, එවැනි අධ්‍යක්ෂවරයකු, නිලධරයකු හෝ හවුල්කරුවකු විසින් තමාගේ දැනීමෙන් තොරව ඒ වරද කරන ලදැයි හෝ එවැනි වරදක් කිරීම වැළැක්වීමට තමා විසින් සියලු නිසි උද්‍යෝගය යොදවන ලදැයි ඔප්පු කරනු ලැබුවහොත්, ඔහු ඒ වරදට වරදකරු ලෙස සලකනු නොලැබිය යුතු ය.

ප්‍රමිති හා පිරිවිතරවලට අනුකූල බව සහතික කිරීමේ කාර්ය සඳහා සාම්පල ලබා ගැනීම.

**61.** (1) විකුණනු ලබන යම් භාණ්ඩයක්, මේ පනතේ 12 වන වගන්තිය යටතේ නියමකර ඇති ප්‍රමිති හා පිරිවිතරවලට අනුකූල නොවන බව විශ්වාස කිරීමට තරම් අධිකාරියට හේතු ඇති අවස්ථාවක, අධිකාරිය විසින් ,–

(අ) ඒ භාණ්ඩයේ සාම්පලයක් ,–

(i) ඒ භාණ්ඩය සාදන්නකු හෝ වෙළෙන්දකු තම වෙළෙඳ ව්‍යාපාරය පවත්වා ගෙන යනු ලබන යම් පරිශ්‍රයකින් ;

(ii) එවැනි යම් භාණ්ඩයක් ගබඩා කරනු ලබන හෝ විකිණීම සඳහා අනාවරණය කරනු ලබන යම් පරිශ්‍රයකින් ; හෝ

(iii) ඒ භාණ්ඩ ප්‍රවාහනය කරනු ලබන යම් වාහනයකින්,

ලබාගැනීම සඳහා යම් නිලධරයකුට ලියවිල්ලකින් බලය දෙනු ලැබිය හැකි ය ; තව ද

(ආ) ඒ සාම්පලය ලබා ගන්නේ යම් සාදන්නකු හෝ වෙළෙන්දකු සන්තකයේ තිබී ද, ඒ සාදන්නා හෝ වෙළෙන්දා වෙත, විධානයේ නිශ්චය කරනු ලැබිය යුතු කාලයක් සඳහා ඒ භාණ්ඩ විකිණීමෙන් හෝ විකිණීම සඳහා අනාවරණය කිරීමෙන් වළකින ලෙසට වූ විධානයක් නිකුත් කරනු ලැබිය හැකි ය. කෙසේ වුව ද, ඒ කාලය, ඒ විධානය නිකුත් කිරීමේ දින පටන් සති හයක කාලයක් නොඉක්මවිය යුතු ය.

(2) 12 වන වගන්තිය යටතේ නියම කරනු ලැබ ඇති ප්‍රමිති හා පිරිවිතරවලට ඒ භාණ්ඩය අනුකූල වන්නේ දැයි නිශ්චය කිරීමේ කාර්ය සඳහා අනුමත රස පරීක්ෂකවරයකු වෙත සාම්පල යැවීම සාම්පලය භාරගත් නිලධරයාගේ කාර්යය විය යුතු අතර, එකී අනුමත රස පරීක්ෂකවරයා විසින් විශේෂ අවස්ථානුගත කරුණු යටතේ දී හැර, සිය වාර්තාව, සාම්පලය ලැබීමෙන් මාස එකක් නොඉක්මවන කාලයක් ඇතුළත අධිකාරිය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) අනුමත රස පරීක්ෂකවරයාගේ වාර්තාව ලැබුණු විට, අධිකාරිය විසින් ,–

(අ) අදාළ භාණ්ඩය 12 වන වගන්තිය යටතේ නියම කරන ලද ප්‍රමිති හා පිරිවිතරවලට අනුකූල වන බව හෙළිදරව් කරන අවස්ථාවක, (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද විධානය මගින් පනවන ලද සීමිත තහනම වහාම ඉවත් කරනු ලැබිය යුතු ය ; නැතහොත්,

(ආ) භාණ්ඩය මේ පනතේ 12 වන වගන්තිය යටතේ නියම කරන ලද ප්‍රමිති හා පිරිවිතරවලට අනුකූල නොවන බව සහ ඒ අනනුකූලතාව නිසා අදාළ භාණ්ඩය යම් ප්‍රයෝජනයකට ගත නොහැකි හෝ පරිභෝජනය සඳහා නුසුදුසු තත්ත්වයකට පත් වී ඇති බව හෙළිදරව් වන අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, ඒ භාණ්ඩය හෝ භාණ්ඩ තොගය තහනමට ගෙන රඳවා තබාගනු ලැබිය යුතු ය.

(4) අවස්ථාවෝචිත පරිදි, යම් භාණ්ඩයක් හෝ භාණ්ඩ තොගයක් (3) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ යම් සාදන්නකුගෙන් හෝ වෙළෙන්දකුගෙන් තහනමට ගෙන රඳවා තබා ගනු ලැබූ අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, එම සාදන්නා හෝ වෙළෙන්දා මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේ ය.

(5) මේ වගන්තිය යටතේ වරදක් සම්බන්ධයෙන් වූ නඩු පැවරීමක දී, වරද කරන ලදැයි කියන්නේ යම් භාණ්ඩයකට අදාළව ද, මේ වගන්තියේ කාර්ය සඳහා ඒ භාණ්ඩයේ අඩංගු ද්‍රව්‍ය හෝ සංයුතිය ප්‍රකාශ කෙරෙන විශ්ලේෂණයක් කරනු පිණිස අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ලියවිල්ලකින් බලය දෙන ලද නිලධරයකුගේ අත්සන යටතේ නිකුත් කරනු ලබන සහතිකයක්, එහි සඳහන් ප්‍රකාශ සම්බන්ධයෙන් බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් වන්නේ ය.

(6) මේ වගන්තිය යටතේ වරදක් සම්බන්ධයෙන් වූ නඩු පැවරීමක් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ ඔහුගේ ලිඛිත අනුමතය ඇතිව හෝ හැර කරනු නොලැබිය යුතු ය.

(7) මේ වගන්තියේ කාර්ය සඳහා "අනුමත රස පරීක්ෂකවරයා" යන්නෙන්, ඒ කර්තව්‍ය ඉටු කිරීමට සුදුසුකම් ලැබ ඇත්තා වූ සහ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අනුමත කරනු ලැබුවා වූ ද තැනැත්තෙක් අදහස් වේ.

පොදු රාජසන්තක කිරීම.

**62.** (1) 61 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ වූ වරදක් සම්බන්ධයෙන් වරදකරු කිරීමක දී ප්‍රමිති හා පිරිවිතරවලට අනුකූල නොවීම හේතුකොටගෙන භාණ්ඩ හෝ භාණ්ඩ තොගය භාවිතය හෝ පරිභෝජනය සඳහා නුසුදුසු බැව් ඔප්පු කරනු ලැබූ අවස්ථාවක –

(අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පිහිටුවන ලද අදාළ පළාතේ මහාධිකරණය වෙත අදාළ, වරදකරු කිරීමට එරෙහිව ඒ සඳහා ඉඩ දී ඇති කාලය ඇතුළත අභියාචනයක් ඉදිරිපත් කර නොමැත්තේ නම් ; හෝ

(ආ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පිහිටුවන ලද අදාළ පළාතේ මහාධිකරණය වෙත අදාළ වරදකරු කිරීමට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කර ඇත්තේ නම් සහ වරදකරු කිරීම ස්ථිර කරනු ලැබ ඇත්නම්,

ඒ භාණ්ඩය හෝ භාණ්ඩ තොගය අධිකරණය විධාන කරන යම් ආකාරයකින් විනාශ කිරීම සඳහා ඒ භාණ්ඩ හෝ භාණ්ඩ තොගය රජය වෙත රාජසන්තක කළ යුතු යයි අධිකරණය විසින් ආඥා කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වරදක් සම්බන්ධයෙන් වූ නඩුවක දී, ප්‍රමිති හා පිරිවිතරවලට අනුකූල නොවීම හේතුකොටගෙන භාණ්ඩ හෝ භාණ්ඩ තොගය භාවිතය හෝ පරිභෝජනය සඳහා නුසුදුසු බව අධිකරණය සෑහීමට පත්වන පරිදි ඔප්පුකර නොමැතිවීමේ හේතුව මත චූදිතයා නිදොස් කර නිදහස් කරනු ලැබ ඇති අවස්ථාවක –

(අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පිහිටුවන ලද අදාළ පළාතේ මහාධිකරණය වෙත අදාළ නිදොස් කර නිදහස් කිරීමට එරෙහිව ඒ සඳහා ඉඩ දී ඇති කාලය ඇතුළත අභියාචනයක් ඉදිරිපත් කර නොමැති නම් ; හෝ

(ආ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පිහිටුවන ලද අදාළ පළාතේ මහාධිකරණය වෙත අදාළ නිදොස් කර නිදහස් කිරීමට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කර ඇත්තේ නම් සහ නිදොස් කර නිදහස් කිරීම අභියාචනාධිකරණය විසින් ස්ථිර කරනු ලැබ ඇත්තේ නම්,

තහනමට ගත් භාණ්ඩ හෝ භාණ්ඩ තොගය මුදා හැරීමට අධිකරණය විසින් ආඥා කරනු ලැබිය යුතු ය.

61 වන වගන්තිය යටතේ වූ නඩු සම්බන්ධයෙන් ප්‍රමුඛතාව දිය යුතු බව.

**63.** 61 වන වගන්තිය යටතේ යම් අධිකරණයක් ඉදිරියේ ගොනු කරන ලද යම් නඩුවක් නිම කිරීම සඳහා සහ ඒ සම්බන්ධයෙන් වූ යම් වරදකරු කිරීමකට හෝ පනවන ලද යම් නියමයකට හෝ එරෙහිව කරන ලද යම් අභියාචනයක් විභාග කිරීම සඳහා ඒ සෑම අධිකරණයක් විසින් ම ප්‍රමුඛතාව දෙනු ලැබිය යුතු ය.

මේ පනත යටතේ කරන ලද ක්‍රියා සම්බන්ධයෙන් ආරක්ෂාව.

**64.** මේ පනත යටතේ කරන ලද ක්‍රියා සම්බන්ධයෙන්,

(අ) මේ පනත යටතේ අධිකාරිය විසින් සද්භාවයෙන් කරන ලද හෝ කිරීමට අදහස් කරන ලද බවට උද්දේශිත යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් අධිකාරියට විරුද්ධව ; හෝ

(ආ) මේ පනත යටතේ හෝ අවස්ථාවෝචිත පරිදි අධිකාරියේ හෝ සභාවේ විධානය මත අධිකාරියේ යම් සාමාජිකයකු, අධ්‍යක්ෂ ජනරාල්වරයා, අධ්‍යක්ෂවරයකු, නියෝජ්‍ය අධ්‍යක්ෂවරයකු, සහකාර අධ්‍යක්ෂවරයකු, නිලධරයකු, සේවකයකු හෝ උපදේශකයකු විසින් හෝ සභාවේ යම් සාමාජිකයකු විසින් සද්භාවයෙන් කරන ලද හෝ කිරීමට අදහස් කරන ලද බවට උද්දේශිත යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් අධිකාරියේ ඒ සාමාජිකයාට, අධ්‍යක්ෂ ජනරාල්වරයාට, අධ්‍යක්ෂවරයාට, නියෝජ්‍ය අධ්‍යක්ෂවරයාට, සහකාර අධ්‍යක්ෂවරයාට, නිලධරයාට, සේවකයාට හෝ උපදේශකයාට හෝ සභාවේ සාමාජිකයාට විරුද්ධව,

කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

අරමුදලින් වියදම් ගෙවිය යුතු බව.

**65.** (1) යම් අධිකරණයක් ඉදිරියේ අධිකාරිය විසින් හෝ අධිකාරියට එරෙහිව ඉදිරිපත් කරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී අධිකාරිය විසින් දරන ලද වියදම් කිසිවක්, අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර, එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී අධිකාරියට ගෙවන ලද හෝ අධිකාරිය විසින් අයකර ගන්නා ලද ගාස්තු කිසිවක් අධිකාරියේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

**(2)** අධිකාරියේ යම් සාමාජිකයකු, අධ්‍යක්ෂ ජනරාල්වරයා, අධ්‍යක්ෂවරයකු, නියෝජ්‍ය අධ්‍යක්ෂවරයකු, සහකාර අධ්‍යක්ෂවරයකු, නිලධරයකු, සේවකයකු හෝ උපදේශකයකු විසින්

හෝ සභාවේ යම් සාමාජිකයකු විසින් මේ පනත යටතේ හෝ අධිකාරියේ හෝ සභාවේ විධාන මත කරන ලද හෝ කිරීමට අදහස් කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක ඉදිරියේ ඒ තැනැත්තා විසින් හෝ ඒ තැනැත්තාට විරෙහිව පවරා ගෙනෙන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී ඒ තැනැත්තා විසින් දරන ලද වියදම් කිසිවක්, ඒ ක්‍රියාව සද්භාවයෙන් කරන ලදැයි අධිකරණය පිළිගන්නේ නම්, ඒ වියදම් ඒ සිවිල් හෝ අපරාධ නඩුවේ දී ඔහු විසින් අය කරගනු ලබන්නේ නම් මිස, අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

අධිකාරියේ සහ සභාවේ සාමාජිකයන් සහ නිලධරයන් සහ අධිකාරියේ සේවකයන් රජයේ සේවකයන් ලෙස සැලකිය යුතු බව.

**66.** අධිකාරියේ සහ සභාවේ සියලු සාමාජිකයන්, අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා, අධ්‍යක්ෂවරයන්, නියෝජ්‍ය අධ්‍යක්ෂවරයන්, සහකාර අධ්‍යක්ෂවරයන්, නිලධරයන්, සේවකයන් සහ උපදේශකයන –

(අ) දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රජයේ සේවකයන් ; සහ

(ආ) මේ පනත යටතේ වැරදි සම්බන්ධයෙන් නඩු පැවරීමේ කාර්ය සඳහා 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 136 වන වගන්තියේ අර්ථානුකූලව රජයේ සේවකයන්,

වශයෙන් සලකනු ලැබිය යුතු ය.

අල්ලස් පනතේ අර්ථානුකූලව අධිකාරිය සහ සභාව උපලේඛනගත ආයතනයන් වශයෙන් සැලකිය යුතු බව.

**67.** අල්ලස් පනතේ අර්ථානුකූලව අධිකාරිය සහ සභාව උපලේඛනගත ආයතනයන් වශයෙන් සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගනු ලැබිය යුතු ය.

නියෝජිතයන්ගේ හා සේවකයන්ගේ වැරදි සම්බන්ධයෙන් ප්‍රධානියා වගකිව යුතු බව.

**68.** මේ පනත යටතේ වූ යම් වරදක් යම් සාදන්නකුගේ හෝ වෙළෙන්දකුගේ නියෝජිතයකු හෝ සේවකයකු විසින් කරනු ලැබ ඇති අවස්ථාවක, ඒ වරද තමාගේ දැනීමක් නොමැතිව කරන ලද බැව් ඒ සාදන්නා හෝ වෙළෙන්දා ඔප්පු කරන්නේ නම් මිස, ඒ වරද ඔහු විසින් කරන ලද වරදක් ලෙස සලකනු ලැබිය යුතු ය.

**69.** යම් තැනැත්තකු මේ පනත යටතේ යම් වරදකට වරදකරු කරනු ලැබූ අවස්ථාවක, හෝ මේ පනත යටතේ යම් භාණ්ඩයක් තහනමට ගනු ලැබ රාජසන්තක කිරීමට ආඥා කරනු ලැබූ අවස්ථාවක, අධිකාරිය විසින් - ඇතැම් තැනැත්තනට ත්‍යාග මුදල් දිය යුතු බව.

(අ) ඒ වරදකරු කිරීමට හෝ ඒ භාණ්ඩය තහනමට ගැනීමට හා රාජසන්තක කිරීමට තුඩුදෙන තොරතුරු සැපයූ තැනැත්තාට ; සහ

(ආ) ඒ වරද සොයා දැන ගැනීමෙහි හෝ ඒ භාණ්ඩය තහනමට ගැනීම හා රාජසන්තක කිරීම ක්‍රියාත්මක කිරීමෙහි ලා සම්බන්ධතාවක් ඇති යම් තැනැත්තකුට,

සාධාරණ යයි අධිකාරිය සලකනු ලබන ත්‍යාග මුදල් ගෙවනු ලැබිය හැකි ය.

**70.** 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ පටහැනිව කුමක් සඳහන් වුව ද, මේ පනත යටතේ වූ සෑම වරදක් ම, ඒ පනතේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා සංඥෙය වරදක් ලෙස සලකනු ලැබිය යුතු ය. වැරදි, සංඥෙය වැරදි විය යුතු බව.

**71.** 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත මගින් සාම නිලධරයන් වෙත පවරා ඇති බලතල කිසිවක් ක්‍රියාත්මක කිරීමේ කාර්ය සඳහා අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා, අධ්‍යක්ෂවරයන්, නියෝජ්‍ය අධ්‍යක්ෂවරයන් සහ සහකාර අධ්‍යක්ෂවරයන් ඒ පනතේ අර්ථානුකූලව සාම නිලධරයන් වශයෙන් සලකනු ලැබිය යුතු ය. ඇතැම් නිලධරයන් සාම නිලධරයන් විය යුතු බව.

**72.** (1) නියම කරනු ලැබිය යුතු යයි මේ පනතින් නියමිත හෝ නියෝග සෑදිය යුතු යයි මේ පනතින් බලය දී ඇති යම් කාරණයක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය. නියෝග.

(2) විශේෂයෙන් ම සහ (1) වන උපවගන්තිය මගින් පැවරී ඇති බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, පහත සඳහන් කාරණා සියල්ලම හෝ ඉන් යම් කාරණයක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය :–

(අ) අධිකාරියේ රැස්වීම් කැඳවිය යුතු ආකාරය නියම කිරීම ;

(ආ) අධිකාරියේ රැස්වීම් පැවැත්විය යුතු ආකාරය නියම කිරීම ;

(ඇ) අධිකාරිය හා සභාව විසින් පවත්වනු ලබන පරීක්ෂණ හා විමර්ශනවලට පැමිණිය යුතු යයි දැනුම් දෙන ලද සාක්ෂිකරුවන්ගේ වියදම් ගෙවිය යුතු තැනැත්තන් හා ගෙවිය යුතු ආකාරය නියම කිරීම.

(3) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලැබූ දින හෝ ඒ නියෝගයේ සඳහන් යම් පසු දිනයක හෝ එය ක්‍රියාත්මක විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම, එය ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු හැකි පහසු ඉක්මනින් අනුමතය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත නොකරන ලද යම් නියෝගයක් ඒ අනනුමතයේ දින පටන් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු නමුත්, ඒ යටතේ කලින් කරන ලද යම් දෙයකට ඉන් හානියක් නොවිය යුතු ය.

(5) අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියෝගයක් පරිච්ඡින්න කරන ලදැයි එසේ සලකනු ලැබූ දින පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

1979 අංක 1 දරන පාරිභෝගික ආරක්ෂක පනත, 1987 අංක 1 දරන සාධාරණ වෙළෙඳ කොමිෂන් සභා පනත, (173 වන අධිකාරිය), මිල පාලන පනත ඉවත් කිරීම සහ ඉතිරි කිරීම්.

**73.** (1) (අ) 1979 අංක 1 දරන පාරිභෝගික ආරක්ෂක පනත මෙයින් ඉවත් කරනු ලැබේ :

(ආ) ඉහත කී පනත ඉවත් කිරීම නොතකා :–

(i) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වූ දිනයට පෙරාතුව ම වූ දිනයේ දී බලාත්මකව පවත්නා –

(අඅ) ඉවත් කරන ලද පනතේ 3 වන වගන්තිය යටතේ පළ කරන ලද බෙදා හැරීම පිළිබඳ සෑම යෝජනාක්‍රමයක් ;

(ආආ) ඉවත් කරන ලද පනතේ 6 වන වගන්තිය යටතේ අභ්‍යන්තර වෙළෙඳ කොමසාරිස් විසින් නිකුත් කරන ලද සෑම පොදු විධානයක් ;

(ඇඇ) ඉවත් කරන ලද පනතේ 8 වන වගන්තිය යටතේ අභ්‍යන්තර වෙළෙඳ කොමසාරිස් විසින් නිශ්චය කරන ලද සෑම ප්‍රමිතියක් හා පිරිවිතරයක් ; සහ

(ඈඈ) ඉවත් කරන ලද පනතේ 10 වන වගන්තිය යටතේ අභ්‍යන්තර වෙළෙඳ කොමසාරිස් විසින් යම් සාදන්නකු, වෙළෙන්දකු හෝ සාදන්නන්ගේ හෝ වෙළෙන්දන්ගේ යම් සංගමයක් හෝ සමග ඇතුළත් වූ සෑම ලිඛිත ගිවිසුමක්,

අධිකාරිය විසින් පළ කරන ලද යෝජනා ක්‍රමයක්, නිකුත් කරන ලද විධානයක්, නිශ්චය කරන ලද ප්‍රමිතියක් හා පිරිවිතරයක් සහ ඇතුළත් වූ ගිවිසුමක් ලෙස සලකනු ලැබිය යුතු ය :

(ii) ඉවත් කරන ලද පනතේ 33අ වගන්තිය යටතේ පිහිටුවන ලද පාරිභෝගික ආරක්ෂක අරමුදලේ බැරට මේ පනත ආරම්භ වූ දිනට පෙරාතුව ම වූ දින ඇති සියලු මුදල්, ඒ දින සිට මේ පනත යටතේ පිහිටුවන ලද අරමුදලට මාරු කර ඇති ලෙස සැලකිය යුතු ය ;

(iii) ඉවත් කරන ලද පනතේ 34 වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදන ලද්දා වූ ද මේ පනත ආරම්භ වන දින බලාත්මකව තිබෙන්නා වූ ද මේ පනතේ විධිවිධානවලට අනනුකූල නොවන්නා වූ ද සෑම නියෝගයක් ම, මේ පනත යටතේ සාදන ලද නියෝග ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව, එම නියෝග, මේ පනත යටතේ සාදන ලද නියෝග මගින් සංශෝධනය කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය ;

(iv) ඉවත් කරන ලද පනත යටතේ ස්වකීය නිල තත්ත්වයෙන් අභ්‍යන්තර වෙළෙඳ දෙපාර්තමේන්තුව නියෝජනය කරන්නා

වශයෙන් නීතිපතිවරයා විසින් හෝ ඔහුට විරුද්ධව යම් අධිකරණයක හෝ විනිශ්චයාධිකාරයක පවරනු ලැබ මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ නොනිමි පැවති සියලු සිවිල් හෝ අපරාධ නඩු අධිකාරිය විසින් හෝ ඊට විරුද්ධව පවරන ලද සිවිල් හෝ අපරාධ නඩු වශයෙන් සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව දිගටම පවත්වා ගෙන යා යුතු ය;

(v) ස්වකීය නිල නාමයෙන් අභ්‍යන්තර වෙළෙඳ දෙපාර්තමේන්තුව නියෝජනය කරන්නා වශයෙන් නීතිපතිවරයාගේ වාසියට හෝ ඔහුට විරුද්ධව යම් නීති බලය ඇති අධිකරණයක් විසින් ඇතුළත් කරන ලද හෝ කරන ලද සහ මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින ඉටු නොකර ඉතිරිව ඇති සියලු තීන්දු ප්‍රකාශ සහ ආඥා අධිකාරියේ වාසියට හෝ ඊට විරුද්ධව ඇතුළත් කරන ලද හෝ කරන ලද තීන්දු ප්‍රකාශ සහ ආඥා ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ අනුව බලාත්මක කරනු ලැබිය යුතු ය;

(vi) අභ්‍යන්තර වෙළෙඳ දෙපාර්තමේන්තුව විසින්, සමග හෝ වෙනුවෙන් ඇතිකරගත් සියලු ණය, බැඳීම්, වගකීම් සහ කැපකිරීම් සහ කිරීමට යොදා ගත් සියලු කාරණා හා දේ අධිකාරිය විසින්, සමග හෝ වෙනුවෙන් ඇතිකරගත් හෝ කිරීමට යොදා ගත් ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) (අ) 1987 අංක 1 දරන සාධාරණ වෙළෙඳ කොමිෂන් සභා පනත මෙයින් ඉවත් කරනු ලැබේ :

(ආ) ඉහත කී පනත ඉවත් කිරීම නොතකා -

(i) ඉවත් කරන ලද පනතේ 30 වන වගන්තිය යටතේ පිහිටුවන ලද අරමුදලේ බැරට මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට

පෙරාතුව ම වූ දිනයෙහි පවතින සියලු මුදල් මේ පනත යටතේ පිහිටුවන ලද අධිකාරියේ අරමුදලට මාරු කරනු ලැබිය යුතු ය ;

(ii) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ සාධාරණ වෙළෙඳ කොමිෂන් සභාව ඉදිරියේ නොනිමව පවතින සියලු පරීක්ෂණ සහ විමර්ශන මේ පනතේ විධිවිධාන යටතේ අධිකාරිය ඉදිරියේ නොනිමව පවතින පරීක්ෂණ සහ විමර්ශන වශයෙන් සැලකිය යුතු අතර ඒ අනුව මේ පනතේ විධිවිධාන යටතේ එම අධිකාරිය ඉදිරියේ දිගටම පවත්වා ගෙන ගොස් නිම කරනු ලැබිය යුතු ය ;

(iii) ඉවත් කරන ලද පනතේ 18 වන වගන්තිය යටතේ කරන ලද සියලු ඉල්ලීම් සහ ඉවත් කරන ලද පනත යටතේ සාධාරණ වෙළෙඳ කොමිෂන් සභාවට යොමු කරනු ලැබූ මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ ඒ කොමිෂන් සභාව ඉදිරියේ නොනිමව පවතින සියලු ප්‍රශ්න, මේ පනත යටතේ අධිකාරියට කරන ලද ඉල්ලීම් සහ යොමු කරන ලද ප්‍රශ්න වශයෙන් සලකනු ලැබිය යුතු අතර ඒ අනුව අධිකාරිය විසින් මේ පනතේ විධිවිධාන යටතේ පරීක්ෂා කර විභාග කරනු ලැබිය යුතු ය ;

(iv) ඉවත් කරන ලද පනතේ විධිවිධාන යටතේ සාධාරණ වෙළෙඳ කොමිෂන් සභාව විසින් කරන ලද සියලු නියම සහ ඉදිරිපත් කරන ලද වාර්තා, මේ පනතේ විධිවිධාන යටතේ අධිකාරිය විසින් කරන ලද නියම සහ ඉදිරිපත් කරන ලද වාර්තා වශයෙන් සලකනු ලැබිය යුතු ය ;

(v) යම් අධිකරණයක හෝ විනිශ්චයාධිකාරයක සාධාරණ වෙළෙඳ කොමිෂන් සභාව විසින් හෝ ඊට විරුද්ධව පවරන ලදුව, මේ

පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ නොනිමී පැවති සියලු සිවිල් හා අපරාධ නඩු අධිකාරිය විසින් හෝ ඊට විරුද්ධව පවරන ලද සිවිල් සහ අපරාධ නඩු වශයෙන් සැලකනු ලැබිය යුතු අතර ඒ අනුව දිගටම පවත්වා ගෙන යා යුතු ය ;

(vi) සාධාරණ වෙළෙඳ කොමිෂන් සභාවේ වාසියට හෝ ඊට විරුද්ධව කවර හෝ නිසි බලය ඇති අධිකරණයක් විසින් ඇතුළත් කරන ලද හෝ කරන ලද සහ මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින ඉටු නොකර ඉතිරිව ඇති සියලු තීන්දු ප්‍රකාශ සහ ආඥා, අවස්ථාවෝචිත පරිදි, අධිකාරියේ වාසියට හෝ ඊට විරුද්ධව ඇතුළත් කරන ලද හෝ කරන ලද ඒවා සැලකිය යුතු අතර ඒ අනුව බලාත්මක කළ යුතු ය ;

(vii) ඉවත් කරන ලද පනත යටතේ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, මේ පනත ක්‍රියාත්මක වන දිනයේ දී බලාත්මකව පවතින්නා වූ ද, මෙම පනතේ විධිවිධානවලට අනනුකූල නොවන්නා වූ ද, සෑම නියෝගයක් ම මේ පනත යටතේ සාදන ලද නියෝගයක් වශයෙන් සැලකිය යුතු අතර, ඒ අනුව එම නියෝග මෙම පනත යටතේ සාදන ලද නියෝග මඟින් සංශෝධනය කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම, කළ හැකි ය ;

(viii) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයෙහි කොමිෂන් සභාවේ නිලධරයන් සහ සේවකයන් වන්නා වූ ද —

(අ) අධිකාරියේ සේවා නියුක්තිය පිරිනමන ලද සහ එය භාරගන්නා ලද්දා වූ ද සියලු නිලධරයන් සහ සේවකයන් මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන

දිනයට පෙරාතුව ම වූ දිනයේ ඔවුන්ට අදාළ වූ සේවා නියම සහ කොන්දේසි වලට වඩා අඩු වාසි සහගත නොවන සේවා නියම සහ කොන්දේසි යටතේ අධිකාරියේ සේවයේ යොදවා ගත යුතු ය ; හෝ

(ආ) අධිකාරියේ සේවා නියුක්තිය පිරිනොනමන ලද්දා වූ හෝ එම සේවා නියුක්තිය පිරිනමන ලදුව එය භාර නොගන්නා වූ නිලධරයන් සහ සේවකයන්, අමාත්‍යවරයා විසින් නිර්ණය කරනු ලබන වන්දියක් ගෙවනු ලැබීමට හිමිකම් ලැබිය යුතු ය ; සහ

(ix) සාධාරණ වෙළෙඳ කොමිෂන් සභාව විසින් හෝ ඒ සමග හෝ ඒ සඳහා ඇති කර ගන්නා ලද සියලු ණය, බැඳීම්, වත්කම් සහ බැරකම් සහ ලියා අත්සන් කරන ලද හෝ ඇතුළත් වන ලද සියලු කොන්ත්‍රාත්තු සහ ගිවිසුම් සහ කිරීමට යොදා ගත් කාරණා හා දේ අධිකාරිය සමග හෝ අධිකාරිය වෙනුවෙන් ඇති කරන ලද, ලියා අත්සන් කරන ලද, ඇතුළත් කරන ලද සහ කිරීමට යොදාගත් ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) (173 වන අධිකාරය වූ) මිල පාලන පනත මෙයින් ඉවත් කරනු ලැබේ.

“මිල පාලන පරීක්ෂක” පිළිබඳ වූ සඳහන් කිරීමක් අධිකාරියේ අදාළ නිලධරයා පිළිබඳ සඳහන් කිරීමක් විය යුතු බව.

**74.** මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වූ දිනයේ සිට සහ ඉන් පසුව යම් ලිඛිත නීතියක “මිල පාලන පරීක්ෂක” පිළිබඳ කර ඇති සෑම සඳහන් කිරීමක් ම, අධිකාරිය විසින්, ද්‍රව්‍යවල මිල නියම කිරීම විධිමත් කිරීම සම්බන්ධයෙන් වූ කටයුතු ඉටු කිරීම පවරා ඇති අධිකාරියේ අදාළ නිලධරයකු පිළිබඳ කරන ලද සඳහන් කිරීමක් ලෙස කියවා තේරුම් ගත යුතු ය.

අර්ථ නිරූපණය.

**75.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි –

"පාරිභෝගිකයා" යන්නෙන්, වෙළෙන්දකු හෝ සාදන්නකු විසින් ප්‍රතිප්‍රදානයක් සඳහා ලබාගැනීමට සලස්වන යම් භාණ්ඩ හෝ සේවා නියම වශයෙන් භාවිත කරන්නකු හෝ භාවිත කරනු ඇතැයි බලාපොරොත්තු විය හැකි තැනැත්තකු අදහස් වේ ;

"සභාව" යන්නෙන්, මේ පනතේ 39 වන වගන්තියෙන් පිහිටුවන ලද පාරිභෝගික කටයුතු පිළිබඳ සභාව අදහස් වේ ;

"ඉන්ධන" යන්නට, ද්‍රව හෝ වායු ස්වරූපයෙන් යුත් සියලු පැට්‍රෝලියම් නිෂ්පාදන, තෙල්, වෙනත් වායු, ගල්අඟුරු හෝ ලිහිස්සි තෙල් අදහස් වේ ;

"භාණ්ඩ" යන්නෙන්, යම් ආහාරයක්, පානයක්, රූපලාවන්‍ය ද්‍රව්‍යය හෝ ඉන්ධන සහ අනෙක් සියලු වෙළෙඳ භාණ්ඩ අදහස් වේ ;

"පළාත් පාලන ආයතනය" යන්නෙන්, මහා නගර සභාවක්, නගර සභාවක්, ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර, එ යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරන හා ඉටු කරන බලතලවලට, කාර්ය හා කර්තව්‍යවලට අනුරූප වන්නා වූ හෝ සමාන වන්නා වූ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා, යම්කිසි නීතියකින් හෝ නීතියක් යටතේ හෝ ඇති කොට පිහිටුවන ලද කවර වූ හෝ අධිකාරියක් ඊට ඇතුළත් වේ ;

"මිල" යන්නෙන්, යම් කිසි ආකාරයක අයකිරීමක් අදහස් වේ ;

"පළාත් සභාව" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVIIඅ පරිච්ඡේදය යටතේ පිහිටුවන ලද පළාත් සභාවක් අදහස් වේ ;

"සාදන්නා" යන්නෙන්,

(අ) යම් ද්‍රව්‍යයක් හෝ යම් භාණ්ඩයක් සාදන ;

(ආ) රසායනික ක්‍රියාවලියක් හෝ වෙනත් ආකාරයකින් යම් ද්‍රව්‍යයක් හෝ යම් භාණ්ඩයක් එකලස් කරන හෝ සම්බන්ධ කරන ; හෝ

(ඇ) යම් ද්‍රව්‍යයක් හෝ යම් භාණ්ඩයක් විකිණීම සඳහා සකස් කරන,

යම් තැනැත්තෙක් අදහස් වේ ;

"සේවාව" යන්නෙන්, නියම වශයෙන් භාවිත කරන්නන්ට හෝ භාවිත කරනු ඇතැයි බලාපොරොත්තු විය හැකි තැනැත්තන්ට ලබාගැනීමට සලස්වනු ලබන කවර හෝ විස්තරයකට අයත් සේවාවක් අදහස් වන අතර ඊට,

(අ) බැංකු, මූල්‍ය සම්පාදනය, රක්ෂණ, හැම්ගත කිරීමේ කටයුතු සහ විනෝදය ;

(ආ) භාණ්ඩ ඉදිකිරීම, නිපදවීම, සැදීම, සැපයීම, ගබඩා කිරීම, නඩත්තු කිරීම, අළුත්වැඩියා කිරීම, නිවාරණය, පවිත්‍ර කිරීම, පිරිසැකසුම් කිරීම හෝ වෙනස් කිරීම ;

(ඇ) භාණ්ඩ ආනයනය, අපනයනය හෝ බෙදා හැරීම හා සම්බන්ධිත සේවා ;

(ඈ) භාණ්ඩ සහ මගී ප්‍රවාහනය ;

(ඉ) ගොඩනැගිලි සහ ගොඩනැගිලි පරිශ්‍ර පවිත්‍ර කිරීම ;

(ඊ) විදුලිය, ජලය, ගෑස් සහ විදුලි සංදේශ සේවා ඇතුළත් උපයෝගිතා සේවා ලෙලවිය හා සැපයීම;

(උ) තොරතුරු තාක්ෂණය සහ සංදේශන සේවා සැලැස්වීම ;

(ඌ) ගිණුම්කරණය, විගණනය, නීති සේවා, වෛද්‍ය සහ සෞඛ්‍ය සේවා, මිනුම්. ගෘහ නිර්මාණ සහ ඉංජිනේරු යනා දී වෘත්තිය සේවා,

ඇතුළත් වේ :

"වෙළෙන්ද" යන්නෙන්,

(අ) තොග වශයෙන් වෙනත් තැනැත්තන්ට භාණ්ඩ විකුණන හෝ සපයන ;

(ආ) සිල්ලර මිලට පාරිභෝගිකයන්ට භාණ්ඩ විකුණන හෝ සපයන ;

(ඇ) විකිණීම හෝ සැපයීම සඳහා භාණ්ඩ ආනයනය කරන ;

(ඈ) ප්‍රතිෂ්ඨාවක් සඳහා සේවා සපයන,

යම් තැනැත්තෙක් අදහස් වේ .

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**76.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පවත්නා ගිවිසුම්වලින් නිදහස් කිරීම.

**77.** මේ පනතේ මීට ඉහතින් වූ විධිවිධානවල පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, ආණ්ඩුව සමග ඇතුළත් වූ මේ පනත ක්‍රියාත්මක වන දිනයේ දී බලාත්මකව පවතින්නා වූ ගිවිසුමක් යටතේ භාණ්ඩ හෝ සේවා සපයන්නේ කවර තැනැත්තකු විසින ද ඒ තැනැත්තා හට, පනත ක්‍රියාත්මක වන දිනයේ දී ගිවිසුමෙහි නිශ්චිතව සඳහන් බලාත්මකව පවත්නා කාලය පවතිනතාක් කල් එසේ භාණ්ඩ හෝ සේවා සැපයීම කෙරෙහි, තරග විරෝධී චර්යා සම්බන්ධයෙන් මේ පනතේ ඇති විධිවිධාන අදාළ නොවිය යුතු ය.

## උපලේඛනය [3(4) වන වගන්තිය]

පත්වීමට නුසුදුසුකම්.

1. යම් තැනැත්තකු -

(අ) ඔහු පාර්ලිමේන්තුවේ, යම් පළාත් සභාවක හෝ යම් පළාත් පාලන ආයතනයක සාමාජිකයකු නම් හෝ වේ නම් :

(ආ) ඔහු ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නේ නම් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසියකුව සිටීම නතර වන්නේ නම් :

(ඇ) ඔහු ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලපවත්නා යම් නීතියක යටතේ සිහිවිකල් තැනැත්තකු බවට නිරණය කර ඇත්නම් හෝ ප්‍රකාශ කරනු ලැබ ඇත්නම් :

(ඈ) ඔහු ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක අධිකරණයක් විසින් නියම කරන ලද බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයකට යටත්ව සිටි නම් හෝ සිටියේ නම් : හෝ

(ඉ) විෂමාචාරය නිසා ඔහු අධිකාරියේ සාමාජිකත්වයෙන් ඉවත් කර ඇත්නම්,

ඔහු අධිකාරියේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ එසේ දිගටම කටයුතු කිරීමට සුදුස්සෙක් නොවිය යුතු ය.

සාමාජිකයන්ගේ ධුර කාලය.

**2.** මරණය, ඉල්ලා අස්වීම හෝ ඉවත් කරනු ලැබීම නිසා කලින් ධුරය හිස් කළහොත් මිස, සභාපතිවරයා සහ පූර්ණකාලීන සාමාජිකයන් හැර, අධිකාරියේ සෑම සාමාජිකයෙක් ම, ඔහුගේ පත්වීමේ දිනයේ සිට අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුතු ය. තව ද ඔහු ධුරයෙන් ඉවත් කරනු ලැබ ඇත්නම් මිස නැවත පත් කරනු ලැබීමට සුදුස්සෙක් විය යුතු ය :

එසේ වුව ද මරණය, ඉල්ලා අස්වීම හෝ ඉවත් කරනු ලැබීම නිසා ධුරය හිස් කළ සාමාජිකයකු වෙනුවට පත් කළ සාමාජිකයකු ඔහු අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයේ ගත නොවූ කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

සාමාජිකයන්ගේ පත්වීම අවසන් කිරීම.

**3.** (1) විෂමාචාරය නිසා හෝ ශාරීරික හෝ මානසික අබලතාවය නිසා සභාපතිවරයා හෝ පූර්ණකාලීන සාමාජිකයකු හැර අධිකාරියේ යම් සාමාජිකයකු ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මඟින් අමාත්‍යවරයා විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය. මේ ඡේදය යටතේ නියමයක් කරනු ලැබ ඇත්තේ යම් සාමාජිකයකු සම්බන්ධයෙන් ද ඒ සාමාජිකයා, නියමය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දිනයේ ධුරය හිස් කළ ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) (1) වන අනුඡේදය යටතේ යම් සාමාජිකයකු ඉවත් කිරීම, කිසිම අධිකරණයක දී ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

සාමාජිකයන් ඉල්ලා අස්වීම.

**4.** තමා ඉල්ලා අස්වන බවට අමාත්‍යවරයාට යොමු කරන ලද ලිපියක් මඟින් කවර හෝ අවස්ථාවක යම් සාමාජිකයකු විසින් සිය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර එම ඉල්ලා අස්වීම, අමාත්‍යවරයා විසින් ලියවිල්ලක් මඟින් භාරගත් විට ක්‍රියාත්මක විය යුතු ය.

මරණය, ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම නිසා ධුරය හිස් කිරීම.

**5.** මරණය, ඉල්ලා අස්වීම හෝ ඉවත් කරනු ලැබීම නිසා අධිකාරියේ යම් සාමාජිකයකු විසින් ධුරය හිස් කරන අවස්ථාවක, අමාත්‍යවරයා විසින් 3 වන වගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගනිමින්, ඒ සාමාජිකයාට අනුප්‍රාප්ත වීම සඳහා වෙනත් තැනැත්තකු පත් කළ හැකි ය.

සාමාජිකයන්ට නොපැමිණ සිටීමේ නිවාඩු.

**6.** සභාපතිවරයා හෝ පූර්ණ කාලීන සාමාජිකයකු හැර, අසනීපවීම, අබලතාවය හෝ මාස තුනකට නොඅඩු කාලයක් සඳහා ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා අධිකාරියේ සාමාජිකයකු විසින් තමාගේ කාර්ය ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, එම නොහැකියාව ගැන ලියවිල්ලකින් අමාත්‍යවරයාට දැනුම් දීම ඒ සාමාජිකයාගේ කාර්යය විය යුතු ය. ඊට පසුව අමාත්‍යවරයා විසින් 3 වන වගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගනිමින් එම කාල සීමාව ඇතුළත ඔහු වෙනුවට කටයුතු කිරීමට වෙනත් තැනැත්තකු පත් කළ හැකි ය.

සභාපතිගේ පත්වීම අවසන් කිරීම.

**7.** (1) අසනීපවීම, අබලතාවය හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා සභාපතිට හෝ යම් පූර්ණකාලීන සාමාජිකයකුට තමාගේ ධුරයේ කාර්ය ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, ස්වකීය ධුරයේ කාර්ය ඉටුකිරීම සඳහා අමාත්‍යවරයා විසින් අධිකාරියේ වෙනත් සාමාජිකයකු පත් කළ හැකි ය.

(2) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මඟින්, අමාත්‍යවරයා විසින්, විෂමාචාරය හෝ ශාරීරික හෝ මානසික අශක්තතාවය හේතුකොට ගෙන සභාපතිවරයා හෝ යම් පූර්ණ කාලීන සාමාජිකයකු ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය. මේ ඡේදය යටතේ නියමයක් කරනු ලැබ ඇත්තේ කවර තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තා ගැසට් පත්‍රයේ ඒ නියමය පළ කරනු ලැබූ දිනයේ දී සිය ධුරය හිස් කරන ලද සේ සලකනු ලැබිය යුතු ය.

(3) අමාත්‍යවරයා වෙත ලිපියක් යැවීම මඟින්, කවර හෝ වේලාවක දී සභාපතිවරයාට හෝ පූර්ණ කාලීන සාමාජිකයන් ගෙන් කවර හෝ සාමාජිකයකුට සිය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය. ඒ ඉල්ලා අස්වීම, අමාත්‍යවරයා විසින් ලියවිල්ලකින් පිළිගනු ලැබීමෙන් පසු ක්‍රියාත්මක වන්නේ ය.

අධිකාරියේ රැස්වීම.

8. (1) අධිකාරියේ සභාපතිවරයා පැමිණ සිටින්නේ නම්, අධිකාරියේ සෑම රැස්වීමකම මූලාසනය දැරිය යුතු ය. එවැනි යම් රැස්වීමක සභාපතිවරයා පැමිණ නොසිටින අවස්ථාවක, පූර්ණ කාලීන සාමාජිකයන්ගෙන් එක් අයකු විසින් මූලාසනය දැරිය යුතු අතර, අධිකාරියේ එවැනි යම් රැස්වීමකට සභාපතිවරයා සහ පූර්ණ කාලීන සාමාජිකයන් සියලු දෙනාම නොපැමිණි අවස්ථාවක, ඒ රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන් විසින් ඔවුන් අතරින් එක් සාමාජිකයකු ඒ රැස්වීමේ මූලාසනය දැරීම පිණිස තෝරා පත්කර ගත යුතු ය.

(2) අධිකාරියේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් තුනක් විය යුතු ය.

(3) සභාපතිවරයාට හෝ ඔහු නොපැමිණි විට අධිකාරියේ යම් රැස්වීමක මූලාසනය දරන සාමාජිකයාට, ස්වකීය ඡන්දයට අමතරව, තීරණ ඡන්දයක් තිබිය යුතු ය.

(4) මේ ඡේදයේ සහ 72 වන වගන්තිය යටතේ සාදන ලද යම් නියෝගයක විධිවිධානවලට යටත්ව, අධිකාරිය විසින් එහි රැස්වීම්වලට සහ ඒ රැස්වීම්වල කටයුතු සහ ඒ කටයුතු කරගෙන යාමට අදාළ කාර්ය පටිපාටිය විධිමත් කරනු ලැබිය හැකි ය.

පත්වීමෙහි යම් දෝෂයක් හේතු කොටගෙන, කටයුත්තක්, ක්‍රියාවක් හෝ තීරණයක් අවලංගු නොවන බව.

9. අධිකාරියේ ක්‍රියාවක්, තීරණයක් හෝ කටයුත්තක් අධිකාරියේ සාමාජිකයන්ගේ පුරප්පාඩුවක් පැවතීමේ හේතුවෙන් හෝ එහි යම් සාමාජිකයකුගේ පත්වීමෙහි ඇති යම් දෝෂයක් හේතුවෙන් පමණක් අවලංගු ලෙස නොසැලකිය යුතු ය.

අධිකාරියේ මුද්‍රාව.

10. (1) අධිකාරියේ මුද්‍රාව සභාපතිවරයාගේ භාරයේ තිබිය යුතු ය

(2) අධිකාරියේ මුද්‍රාව තැබීම සභාපතිවරයාගේ හෝ එසේ මුද්‍රාව තැබීම සහතික කිරීමට බලය දී ඇති අධිකාරියේ වෙනත් යම් සාමාජිකයකුගේ අත්සන මඟින් සහතික කරනු ලැබිය යුතු ය.

සාමාජිකයන් විසින් සම්බන්ධතා හෙළිදරව් කිරීම.

11. අධිකාරියේ යම් කටයුත්තක හෝ අධිකාරිය විසින් කිරීමට යෝජිත යම් තීරණයක විෂය කාරණය සැලකෙන්නා වූ කිසියම් කාරණයක් සම්බන්ධයෙන් කෙළින්ම හෝ අන්‍යාකාරයෙන් සම්බන්ධතාවක් ඇති අධිකාරියේ සාමාජිකයකු විසින්, අධිකාරියේ රැස්වීමක දී තම සම්බන්ධතාවයේ ස්වභාවය හෙළිදරව් කළ යුතු අතර, ඒ සාමාජිකයා විසින් ඒ කාරණය සම්බන්ධයෙන් වූ යම් කටයුතු කිරීමක දී හෝ තීරණය කිරීමක දී එහි සහභාගි නොවිය යුතු ය.